# <u>මහ සභා වාර්තාව - කටුවන ප්‍රාදේශීය සභාව</u>

# <u>2018 අගෝස්තු මස 16 වන දින</u>

- **08 වන සැසි වාරයේ 05 වන සභා වාර්තාව**

**දිනය :- 2018.08.16 වන දින**

**වේලාව :- පෙ.ව. 10.00**

**ස්ථානය :- ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව - මිද්දෙනිය**

| <u>පැමිණීම</u> | <u>පිටවීම</u> |
|---|---|
| 01. ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා | පෙ.ව.10.00 |
| 02. ගරු ප්‍රා.ස.ම සිරිසේන හෙට්ටිගේ මැතිතුමා | පෙ.ව.10.00 |
| 03. ගරු ප්‍රා.ස.ම සුගත් සරඹගේ මැතිතුමා | පෙ.ව.10.00 |
| 04. ගරු ප්‍රා.ස.ම ජේ. ඒ. ගාමිණී මැතිතුමා | පෙ.ව.10.00 |
| 05. ගරු ප්‍රා.ස.ම. ජේ. ටී. ශාන්ත මැතිතුමා | පෙ.ව.10.00 |
| 06. ගරු ප්‍රා.ස.ම. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා | පෙ.ව.10.00 |
| 07. ගරු ප්‍රා.ස.ම. රමනි හල්පෙ ගමගේ මැතිතුමිය | පෙ.ව.10.00 |
| 08. ගරු ප්‍රා.ස.ම. ඩබ්. එච්. ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා | පෙ.ව.10.00 |
| 09. ගරු ප්‍රා.ස.ම. මානෙල් දිසානායක මැතිතුමිය | පෙ.ව.10.00 |
| 10. ගරු ප්‍රා.ස.ම. ඩබ්. ඒ. සංජීව මැතිතුමා | පෙ.ව.10.00 |
| 11. ගරු ප්‍රා.ස.ම එම්. සී. පී. කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා | පෙ.ව.10.00 |
| 12. ගරු ප්‍රා.ස.ම. එච්. ඒ. ගාමිණී සංජීව මැතිතුමා | පෙ.ව.10.00 |
| 13. ගරු ප්‍රා.ස.ම. ඒ. පී. නිශාන්ත කුමාර මැතිතුමා | පෙ.ව.10.00 |
| 14 . ගරු උපසභාපති එම්. ජයන්ත මැතිතුමා | පෙ.ව.10.00 |
| 15. ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා | පෙ.ව.10.00 |
| 16. ගරු ප්‍රා.ස.ම. එච්. ඒ. ප්‍රදීපා නිසංසලා මැතිතුමිය | පෙ.ව.10.00 |
| 17. ගරු ප්‍රා.ස.ම. පී.එන්. එස්. ගුණවර්ධන මැතිතුමිය | පෙ.ව.10.00 |
| 18. ගරු ප්‍රා.ස.ම. ඊ. බී. ඉන්දික මැතිතුමා | පෙ.ව.10.00 |
| 19. ගරු. ප්‍රා.ස.ම. යූ.ජී.ධර්මසිරි මැතිතුමා | පෙ.ව.10.00 |
| 20. ගරු ප්‍රා.ස.ම. පී. කොඩිතුවක්කු මැතිතුමා | පෙ.ව.10.00 |

21. ගරු ප්‍රා.ස.ම. අයි .කේ. සුසන්ත පද්මතිලක් මැතිතුමා පෙ.ව.10.00

22. ගරු ප්‍රා.ස.ම. එම්. ඩී. සුගතදාස මැතිතුමා පෙ.ව.10.00

23. ගරු ප්‍රා.ස.ම. එම්. සිරිසේන මැතිතුමා පෙ.ව.10.00

24. ගරු ප්‍රා.ස.ම. ඩබ්. ඩී. එම්. ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා. පෙ.ව.10.00

**<u>නොපැමිණීම</u>**

01. ගරු ප්‍රා.ස.ම. කේ. එච් චන්ද්‍රසේන මැතිතුමා

02. ගරු ප්‍රා.ස.ම. ඩබ්. සී. එම්. චමිල් උදාර මැතිතුමා

03. ගරු ප්‍රා.ස.ම. රන්ජන් වීරසේකර මැතිතුමා

04. ගරු ප්‍රා.ස.ම. ඩී. රාජසිංහ මැතිතුමිය

05. ගරු ප්‍රා.ස.ම. එන්. ඒ. එස්. වීරසිරි මැතිතුමිය

06. ගරු ප්‍රා.ස.ම. ජේ. චන්ද්‍රලතා මැතිතුමිය.

**<u>සහභාගී වූ නිලධාරීන්</u>**

01. ලේකම් - ඩබ්. කේ. සුරංග මයා.

02. සංවර්ධන නිලධාරී - ඒ.බී.කේ. සෙව්වන්දි මිය.

03. කළමණාකරණ සහකාර - ජේ. ඒ. චන්ද්‍රලේඛා මිය.

- **<u>ආගම සිහි කිරීම හා ගරු සභාපතිතුමා විසින් සභාව පිළිගැනීම</u>**

ගරු සභාපතිතුමා , ගරු උප සභාපතිතුමා ඇතුළු පැමිණි සිටි ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන් සියළු දෙනා මෙන්ම සහභාගි වූ නිලධාරීන් ප්‍රථමයෙන් ආගම සිහි කරන ලදි. ඉන් පසු ගරු සභාපතිතුමා විසින් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

සියළු දෙනාටම සුබ උදෑසනක්. අද දින කටුවන ප්‍රාදේශීය සභාවේ අගොස්තු මස මහ සභා රැස්වීම සඳහා සහභාගි වූ ගරු උප සභාපතිතුමා, ගරු හිටපු සභාපතිතුමා හා ගරු මන්ත්‍රීතුමන්ලා හා ගරු මන්ත්‍රීතුමියන් සියළු දෙනාම ඉතාම ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. එමෙන්ම සභා රැස්වීම සඳහා සහභාගි වූ ලේකම් මහතා ඇතුළු නිලධාරී දෙපළත් මාධ්‍යවේදී මහතාත් ඉතාමත් ආදරයෙන් හා ගෞරවයෙන් පිළිගනු ලබනවා. මින් ඉදිරියට න්‍යාය පත්‍රානුකූලව සභාවේ වැඩ කටයුතු සිදු කරමු යැයි ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදි.

## <u>01 - පසුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම හා සංශෝධන ඉදිරිපත් කිරීම.</u>

2018 ජූලි මස 19 වන දින පැවති මහ සභා රැස්වීමේ වාර්තාව කියෙව්වා සේ සලකා සභා සම්මත කිරීම සුදුසු බවත්, සංශෝධන හෝ විරෝධතා ඇත්නම් ඉදිරිපත් කරන ලෙස ගරු සභාපතිතුමා යෝජනා කරන ලදි.

ගරු ප්‍රා.ස.ම. කේ. සුනිල් ශාන්ත කුමාර  මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු ප්‍රා.ස.ම. එම්. සිරිසේන මැතිතුමා</u>**

ගිය සභා වාර්තාවේ තීරණ අංක 05 – 7 යටතේ තල්වත්ත ග්‍රාම නිලධාරී වසමේ වීථි ලාම්පු සවි කිරීමේ යෝජනාව මම ස්ථිර කර තිබෙනවා. එහි නම ගරු ප්‍රා. ස. ම. එම්. ඩී. සිරිසේන මැතිතුමා ලෙස සටහන් කර තිබෙනවා. නමුත් එම නම ගරු. ප්‍රා. ස. ම. එම්. සිරිසේන මැතිතුමා ලෙස සංශෝධනය විය යුතුයි.

එම සභා වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීමේදී පංගම්විලයාය මීගහහේන මාර්ගයේ කාණු පිළිසකර කිරීම සඳහා අනුමැතියක් ලබා ගත්තා. එහි වූ අඩුපාඩු පිළිබඳ ගිය සභා වාරයේ කතා කළා. එම වාර්තාවේ එම මාර්ගය පසුගිය දිනක සකස් කර තිබුණා. නමුත් එකතු වී තිබූ වැලි ටික පාර දෙපැත්තට දාලා තියනවා කියා සඳහන් වෙනවා. නමුත් පාර තවම සකස් කලේ නැහැ. එම නිසා පාර කපන්න යෝජනා කර තිබෙනවා. එහි ස්ථාන දෙකක තිබූ පස් ටික පමණක් ඉවත් කර තිබුණා ලෙස සංශෝධනය විය යුතුයි.

මෙම සභා වාර්තාවේ තීරණ අංක 05 – 15 යටතේ මාර්ග කි.මී. 05 ක් අළුත්වැඩියා කිරීමේදී අදාළ කොට්ඨාසයේ වීථි පහන් නඩත්තු කටයුතු සිදු කිරීම ද ඒ සමඟ ක්‍රියාත්මක කළ යුතු යැයි යෝජනා කර තිබෙනවා. නමුත් ඒ සඳහා ව්‍යාපෘතියක් සකස් කළ යුතු වෙනවා. අපි වීථි පහන් උපකරණ ලබා ගෙන ඇති නිසා ව්‍යාපෘතියක් සකස් කර අනුමත කරන තෙක් බලප්‍රදේශයේ වීථි පහන් උපකරණ සවි කරන්න සිටිය යුතු නැහැ. එයට පෙර සවි කරන්න පුළුවන්.

මෙම සභා වාර්තාවේ කටුවන ලැබුන්ගමවත්ත දැව කම්හල පිළිබඳ කතා කළා. එහිදී උප සභාපතිතුමා දැව කම්හල සඳහා දාලා තිබෙන කොන්දේසි එකක්වත් ක්‍රියාත්මක වෙන්නෙ නැහැ. ඒවා ක්‍රියාත්මක වෙනවද කියලා බලන්න අපිට බැහැ. එහෙම බලන්න අපිට අවශ්‍යත් නැහැ කියා පවසා තිබෙනවා. නමුත් එහිදී දැව කම්හල පිළිබඳව නිරතුරුව අධීක්ෂණය වෙනවද කියා සොයා බලන්න වෙලාවක් නැහැ කියා සංශෝධනය විය යුතුයි.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

අපි මාර්ග කි.මී. 05 ක් අළුත්වැඩියා කිරීම ව්‍යාපෘතියක් සකස් කර අනුමත කිරීමත් සමඟ සිදු කරනවා. එහිදී වීථි පහන් නඩත්තු කටයුතුත් සිදු කරනවා. ව්‍යාපෘතියට පෙර අපිට සභා තීරණ අනුව වීථි පහන් නඩත්තු කටයුතු සිදු කරන්න පුළුවන්.  ඉහත සංශෝධනයන්ට යටත්ව 2018 ජූලි මස 19 වන  දින පැවති මහ සභා වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යැයි ගරු සභාපතිතුමා යෝජනා කරන ලදි.

ගරු ප්‍රා.ස.ම. ජේ. ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

2018 ජූලි මස 19 වන දින පැවති මහ සභා වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොමැති බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

**02. ගරු සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන - නැත.**

**03. ප්‍රාදේශීය සභාව අමතා එවා ඇති සංදේශ, පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන - නැත.**

**04. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත.**

**05. යථා පරිදි කල් දී ඇති යෝජනා**

**05 – 1. කඩ කාමර බදු කුලී තක්සේරු කිරීම.**

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අප සභාවට අයත් මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 21 – 25 කඩ කාමර හා දෙවන මහල සඳහා පහත සඳහන් පරිදි මාසික බදු කුලිය තක්සේරු දෙපාර්තමේන්තුව විසින් තක්සේරු කර එවා තිබෙනවා. එම ලැබී ඇති තක්සේරු වටිනාකම අනුව මෙම කාඩ කාමරවලින් 2018 ඔක්තෝබර් මස සිට බදු කුලී අය කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

| කඩ කාමර | මාසික කුළිය ( රු ) |
|---|---|
| 21 – 25 | රු . 5750.00 බැගින් |
| දෙවන මහල | රු. 62000.00 |

ගරු ප්‍රා.ස.ම. ජේ. ටී. ශාන්ත මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්. එච්. ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා.**

මෙම දෙවන මහල හා කඩ කාමර කුමා ස්ටිකර් ආයතනයට ලබා දී තිබුණා. නමුත් තවම වැඩ ආරම්භ කර නැහැ. මෙහි වැඩ ආරම්භ කරන්නෙ නැද්ද? මෙම ස්ථානය අභාවයට යන්න දෙන්න කලින් වැඩ ආරම්භ කරන්න ඕන. එම ස්ථානය පරවියන්ගේ වාසස්ථානයක් වෙලා.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මෙම ස්ථානයේ ඉදි කිරීමට යෝජිත ගොඩනැගිලි සැලැස්ම නාගරික සංවර්ධන අධිකාරියෙන් අනුමත වන තෙක් ඔවුන් වැඩ ආරම්භ කර නැහැ. මේ වන විට එය අනුමත වී තිබෙනවා. ඒ නිසා ඉදිරියේදී වැඩ ආරම්භ කරන බව පැවසුවා. ඔවුන්ට මෙම ගොඩනැගිල්ල දීර්ඝකාලීනව බදු දී තිබෙනවා. මාසික බදු මුදල් නිසි පරිදි ගෙවනවා.

මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 21 – 25 දක්වා වූ කඩ කාමර හා දෙවන මහළ සඳහා ලැබී ඇති තක්සේරු වටිනාකම අනුව 2018 ඔක්තෝබර් මස සිට අදාළ බදු කුලී අය කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 2. පෙර පාසල් සඳහා සහතික පත්‍ර මුද්‍රණය කර ගැනීම.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසල් හා බලප්‍රදේශයේ පෙර පාසල් දරුවන් සඳහා වර්ෂ අවසානයේ පෙර පාසල් පාඨමාලාව සාර්ථකව නිම කිරීම වෙනුවෙන් මීට වසර කිහිපයක සිට සහතික පත්‍රයක් නිකුත් කරනු ලැබුවා. ඒ අනුව මෙම වර්ෂයේද එම සහතික පත්‍රය බලප්‍රදේශයේ සියළුම පෙර පාසල්වල දරුවන් සඳහා බෙදා දීමට අදහස් කර ඇති බැවින් ඒ සඳහා සහතික පත්‍ර 2500 ක් පමණ අදාළ මුද්‍රණ ආයතනයකින් මිළකැඳවීම් සිදු කර මුද්‍රණය කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. අපිට සහතික පත්‍රය සමඟ පුංචි ත්‍යාගයක් දෙන්න පුළුවන්නම් හොඳයි.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

බල ප්‍රදේශයේ පෙර පාසල් 90 ට වැඩි සංඛ්‍යාවක් තිබෙනවා. එහි දරුවන් විශාල ප්‍රමාණයක් අධ්‍යාපනය ලබනවා. අපි මේ සහතික පත්‍ර වෙනුවෙන් ලොකු වියදමක් දරනවා. ඒ නිසා සෑම දරුවෙකුටම ත්‍යාගයක් දෙන්න අමාරුයි.

සභා බලප්‍රදේශයට අයත් පෙර පාසල් දරුවන්ට වර්ෂ අවසානයේ ලබා දීම සඳහා සහතික පත්‍ර 2500 ක් අදාළ මුද්‍රණ ආයතනයකින් මිළ කැඳවීම් සිදු කර මුද්‍රණය කර ගැනීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 3. ප්‍රාදේශීය සභාව සතු පෙර පාසල් සඳහා 2019 වර්ෂයට දරුවන් බඳවා ගැනීම.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අප සභාවට අයත් මිද්දෙනිය, මොරගහලගොඩ, රණසිංහගොඩ, කිරම හා ගල්පොතුකන්ද යන පෙර පාසල් සඳහා 2019 වර්ෂයට දරුවන් ඇතුළත් කළ යුතු අතර, ඒ වෙනුවෙන් 2018 සැප්තැම්බර් මස මුල සිට අයදුම්පත් නිකුත් කරනු ලැබේ. මෙහිදී ලැබෙන අයදුම්පත් අනුව සම්මුඛ පරීක්ෂණයකින් දරුවන් බඳවා ගැනීම සිදු කරනු ලැබේ. අපගේ පෙර පාසල් සඳහා දරුවන් බඳවා ගැනීමේ අයදුම්පත් 2018 සැප්තැම්බර් මස මුල සිට නිකුත් කළ යුතු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. සුගත් සරඹගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා.**

අපගේ එක් එක් පෙර පාසල් සඳහා බඳවා ගන්නා දරුවන් ප්‍රමාණය කොපමණද?

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

මේ වන විට පෙර පාසල් පහ තුළ දරුවන් 220 ක් පමණ අධ්‍යාපනය ලබනවා. එවැනි දරුවන් සංඛ්‍යාවක් ලබන වසරෙහි ලැබෙන අයදුම්පත් මඟින් සම්මුඛ පරීක්ෂණයකින් තෝරා ගන්න පුළුවන්. ඇතුළත් වීමේ ගාස්තුවක් ලෙස රු. 500.00 ක මුදලක් අය කරනවා. එමෙන්ම අපි විශාල මුදලක් වාර්ෂිකව වැය කරනවා. නොමිළයේ නිල ඇඳුම් කට්ටල දෙකක් ද එක් දරුවෙකුට ලබා දෙනවා.

2019 වර්ෂයට සභාව සතු පෙර පාසල් සඳහා දරුවන් බඳවා ගැනීමට අදාළව අයදුම්පත් 2018 සැප්තැම්බර් මුල සිට නිකුත් කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 4. ලෝක ළමා දින සැමරුම - 2018

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

කටුවන ප්‍රාදේශීය සභාව හා එහි පුස්තකාල අංශය මඟින් දෙවන වරටත් සංවිධානය කරනු ලබන ලෝක ළමා හා වැඩිහිටි දින සැමරුම කටුවන ඕලන්ද කොටුව කේන්ද්‍ර කර ගනිමින් 2018 ඔක්තෝබර් මස පළමු වන දින පැවැත්වීමට නියමිතව ඇත. මෙහිදී දරුවන් 350 ක් හා ආරාධිත පිරිස 50 ක් සහභාගි කර ගැනීමට කටයුතු සංවිධානය කර ඇත. එබැවින් මෙම වැඩ සටහන පැවැත්වීමට හා පහත සඳහන් ඇස්තමේන්තුව පරිදි වියදම් දැරීමට සුදුසු යැයි යෝජනා කරමි.

**<u>දළ වියදම් ඇස්තමේන්තුව</u>**

| අනු අංකය | වර්ගය | ප්‍රමාණය | ඒකකයක මිල | මුළු මුදල ( රු ) |
|---|---|---|---|---|
| 01 | බටර් කේක් | කි.ගෑ - 04 | රු. 380.00 | 1520.00 |
| 02 | කෙසෙල් ගෙඩි | 50 | 10.00 | 500.00 |
| 03 | බීම ( ලීටර් 1.5 ) | 04 | රු. 360.00 | 1440.00 |
| 04 | බැලූම් පැකට් ( තරඟ කටයුතු හා සැරසිලි සඳහා ) | 04 | ර. 250.00 | 1000.00 |
| 05 | ටොෆි | 200 | රු 2.00 | 400.00 |
| මුළු එකතුව | | | | 4860.00 |

ගරු ප්‍රා. ස. ම. පී. කොඩිතුවක්කු මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු ප්‍රා.ස.ම. එම්. සිරිසේන මැතිතුමා.</u>**

දරුවන් සඳහා යන වියදම් ටෙන් හාට් පදනමින් ලබා දෙනවා කියලා මෙහි සඳහන් කර තිබෙනවා. එම පදනමින් ලබා දෙන හා නොදෙන සේවා මොනවාද?

**ගරු ප්‍රා.ස.ම. ඩබ්. ඩී. එම්. ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.**

මේ වැඩ සටහන සඳහා අපි යම් වියදමක් දැරිය යුතු වෙනවා. ඒ වෙනුවෙන් සංවිධායක මණ්ඩලය යම් මුදලක් අපෙන් ඉල්ලනවා. දරුවන් 350 ක් වෙනුවෙන් යන වියදම් ටෙන් හාට් පදනම දරන බවයි මේකෙන් කියලා තියෙන්නේ.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මෙම වැඩසටහන සඳහා ගිය වර්ෂයේත් ටෙන් හාට් පදනම වියදම් දරා තිබෙනවා. මෙහිදී එම පදනම මඟින් දරුවන් වෙනුවෙන් කෑම බීම, තෑගි හා වැඩසටහනෙහි බොහෝ වියදම් දරනවා. අපි ආරාධිත පිරිස වෙනුවෙන් සංග්‍රහ කිරීමට හා සැරසිලි කටයුතු වෙනුවෙන් වියදම් දරනවා.

කටුවන ප්‍රාදේශීය සභාව හා එහි පුස්තකාල අංශය මඟින් දෙවන වරටත් සංවිධානය කරනු ලබන ලෝක ළමා දින සැමරුම කටුවන ඕලන්ද කොටුව කේන්ද්‍ර කර ගනිමින් 2018 ඔක්තෝබර් මස පළමුවන දින පැවැත්වීමට හා ඒ වෙනුවෙන් ඉදිරිපත් කර ඇති ඇස්තමේන්තුව අනුව වියදම් දැරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 5. සාහිත්‍ය වැඩසටහන - 2018

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

2018 වර්ෂයේ සාහිත්‍ය මාසය නිමිති කර ගෙන අප සභාව හා මිද්දෙනිය පුස්තකාලය හා සභාව සතු සියළු පුස්තකාල එකතුව සාහිත්‍ය වැඩසටහනක් සැප්තැම්බර් මස පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. මෙම වැඩසටහන කිරම ධම්මානන්ද විද්‍යාලීය ශ්‍රවණාගාරයේදී පැවැත්වීමට හා ඒ සඳහා පහත සඳහන් ඇස්තමේන්තුව පරිදි වියදම් දැරීමට සිදුවේ. ඒ අනුව මෙම වැඩසටහන පැවැත්වීමට මෙන්ම ඒ සඳහා යන වියදම් දැරීම සඳහා ප්‍රධාන අමාත්‍ය අනුමැතිය ලබා ගැනීම සුදුසු යැයි යෝජනා කරමි.

**දළ වියදම් ඇස්තමේන්තුව.**

සහභාගීත්වය ළමුන් - 400 අනෙකුත් ආරාධිත අමුත්තන් හා නිලධාරීන් - 100

| අනු අංකය | අවශ්‍ය ද්‍රව්‍ය | ප්‍රමාණය | ඒකකයක මිල ( රු ) | මුදල ( රු ) |
|---|---|---|---|---|
| සංග්‍රහ වියදම් | | | | |
| 01 | සීනි | කි.ග්‍රෑ. 01 | 115.00 | 115.00 |
| 02 | බටර් කේක් | කි.ග්‍රෑ. 20 | 380.00 | 7600.00 |
| 03 | චොක්ලට් බිස්කට් | පැකට් - 01 | 300.00 | 300.00 |
| 04 | කෙසෙල් ගෙඩි | 500 | 12.00 | 6000.00 |
| 05 | බීම කප් | 500 | 15.00 | 7500.00 |
| 06 | තල කැරලි | 100 | 15.00 | 1500.00 |

| | | | | |
|---|---|---|---|---|
| 07 | කිරිපිටි පැකට් | 400 ග්‍රෑ - 01 | 350.00 | 350.00 |
| එකතුව | | | | 23365.00 |
| අනෙකුත් වියදම් | | | | |
| 01 | සම්පත්දායක දීමනාව | එක් අයෙක් සඳහා | 5000.00 | 5000.00 |
| 02 | සැරසිලි කටයුතු සඳහා | - | - | 2500.00 |
| 03 | නව ග්‍රන්ථ මුද්‍රණය සඳහා | - | - | 15000.00 |
| එකතුව | | | | 22500.00 |
| මුළු එකතුව | | | | 45865.00 |

ගරු ප්‍රා. ස. ම. එච්. ඒ. ගාමිණී සංජීව මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්. ඩී. එම්. ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.</u>**

මෙම ඇස්තමේන්තුව අනුව වැඩසටහන සඳහා අවශ්‍ය මුදල පිළිබඳ පැහැදිලි නැහැ. සම්පත්දායක දීමනාව පමණක් අපි දෙමු. ඉන් එහාට යන්න බැරි වෙයි. තවද නව ග්‍රන්ථ මුද්‍රණය සඳහා රු. 15000.00 ක් හිඟ බව දන්වමි කියා සඳහන් කර තිබෙනවා. කුමන පොතක්ද මුද්‍රණය කරන්නේ.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

මෙම ඇස්තමේන්තුවේ නව ග්‍රන්ථ මුද්‍රණය සඳහා පෞද්ගලික ආයතන හා සුබ පතන්නන් මඟින් ( ගාමන්ට් එක ආදී ආයතන මඟින් ) අපිට ප්‍රතිපාදන ලබා දී තිබෙනවා. රු. 15000.00 ක මුදලක් මදි වී තිබෙනවා. අප පුස්තකාලයේ පාඨකයෙකු විසින් රචිත පුස්තකාල හා ප්‍රලේඛන සේවා එකෙහි අනුමත ළමා කතාන්දර පොතක් තමයි මුද්‍රණය කරන්නේ. මේ සඳහා මදි වන මුදල සොයා ගැනීමට අපේ මන්ත්‍රීවරුන්ත් සහයෝගයක් ලබා දෙන්න. මෙම වැඩසටහන සඳහා යන අනෙකුත් වියදම් ප්‍රධාන අමාත්‍ය අනුමැතිය ලබා ගෙන සභා අරමුදලෙන් සිදු කරමු.

2018 වර්ෂයේ සාහිත්‍ය මාසය නිමිති කර ගෙන අප සභාව හා මිද්දෙනිය පුස්තකාලය හා සභාව සතු සියළු පුස්තකාල එකතුව සාහිත්‍ය වැඩසටහනක් සැප්තැම්බර් මස සිදු කිරීමට හා ඒ වෙනුවෙන් වැය වන රු. 30865.00 ඇස්තමේන්තු මුදල ප්‍රධාන අමාත්‍ය අනුමැතිය ලබා ගෙන සිදු කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>05 – 6. කිරම වෙළඳ සංකීර්ණයේ අංක 22 කඩ කාමරය පවරා දීම.</u>

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

කිරම වෙළඳ සංකීර්ණයේ අංක 22 කඩ කාමරය මේ වන විට එච්. කේ. සනත් චතුරංග යන අයට අයත්ව ඇත. නමුත් ඔහුට මෙම කඩ කාමරය පවත්වා ගෙන යාමට අපහසු නිසා ඩබ්.කේ.ඩී.

කුසුමාවතී යන අයට පවරා දීමට 2018.08.07 දිනැති ලිපිය මඟින් කැමැත්ත ප්‍රකාශ කර ඇත. එමෙන්ම ඩබ්.කේ.ඩී. කුසුමාවතී මහත්මිය විසින් එච්. කේ. සනත් චතුරංග මහතාට අයත් කඩ කාමරය 2018.08.07 දිනැති ලිපිය මඟින් පවරා ගැනීමට කැමැත්ත ප්‍රකාශ කර ඇත. ඒ අනුව මෙම කිරම අංක 22 කඩ කාමරය චක්‍රලේඛ අනුව ඩබ්. කේ. ඩී. කුසුමාවතී මහත්මියට පවරා දීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ. ටී. ශාන්ත මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

<u>**ගරු ප්‍රා.ස.ම. ඩබ්. ඩී. එම්. ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.**</u>

අපේ කඩ කාමර අතුරු බදු දීමක් වෙන්නෙ නැහැ නේද?. අපි කඩ කාමර පවරා දෙන ක්‍රමවේදයට අනුව පවරා දෙන්න. මෙහි ඉදිරි කඩ පේළිය ඉවත් කරන්නෙ නැද්ද? කිරම නගර සංවර්ධනය එනව නම් ගොඩක් හොඳයි. එහිදී කිරම ඉදිරිපස කඩ පේළිය ඉවත් කරනව නම් නගරය ලස්සන වෙනවා. එවිට භූමිය හිස් වෙනවා. රැස්වීමක් කරන්න ලොකු ඉඩක් එනවා. පරිසරයත් ලස්සන වෙනවා.

<u>**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**</u>

ඉදිරි කඩ පේළිය ඉවත් වන්නෙ නැහැ. උඩ තට්ටුවේ ස්ලැබ් එක දාන ලද ටිකේ කඩ කාමර හදලා ඒ අයට ලබා දෙන්න සැලසුමක් තිබුණා. නමුත් එය සිදු වෙලා නැහැ. අපි කඩ කාමර අතුරු බදු දෙන්නෙ නැහැ. චක්‍රලේඛ අනුව පවරා දීම සිදු කරනවා.

කිරම අංක 22 කඩ කාමරය චක්‍රලේඛ අනුව ඩබ්. කේ. ඩී. කුසුමාවතී මහත්මියට පවරා දීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>05 – 7. වරාපිටිය 14 කලාපයේ ඇති අතුරු මාර්ග මෝටර් ග්‍රේඩර් කිරීම.</u>

<u>**ගරු ප්‍රා.ස.ම. ජේ. ටී. ශාන්ත මැතිතුමා.**</u>

වරාපිටිය 14 කලාපය තුළ ඇති පහත සඳහන් අතුරු මාර්ග මෝටර් ග්‍රේඩර් කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

01. වරාපිටිය ජනශක්ති බැංකුව අසලින් ඇති පාර 200 m ක් සකස් කිරීම.

02. වරාපිටිය සපුත්න්ත්‍රිකන්ද මාර්ගය 500 m ක් සකස් කිරීම.

03. රම්මල මහින්දාරාම විහාරස්ථානය ළඟ සිට සපුතන්ත්‍රිකන්ද දෙසට 2 km ක් දුර පාර දෙපස සකස් කිරීම.

04. රම්මල පාසල ඉදිරිපිටින් ඇති මාර්ගය 300 m ක් සකස් කිරීම.

05. කොන්කරහේන ජන සුවය මධ්‍යස්ථානය ළඟ සිට ඉදිරියට 300 m ක් සකස් කිරීම සහ එම මධ්‍යස්ථානයේ සිට වමට ඇති මාර්ගය 100 m ක් සකස් කිරීම.

06. කම්හල්ගොඩ මාර්ගය 500 m ක් සකස් කිරීම.

07. කෝන්කරහේන ඉදල්හේන්ගොඩ මාර්ගය 300 m ක් සකස් කිරීම.

08. හග්ගිතකන්ද විහාරස්ථානය ළඟ සිට කොන්කරහේන දෙසට 400 m ක් මාර්ගය දෙපස සකස් කිරීම.

09. කැරැදෙනිය සතරමං හන්දියේ සිට යද්දෙහිගොඩට 500 m ක් සකස් කිරීම.

10. කැරැදෙනිය මියනකොළදෙනිය මාර්ගය 200 m ක් සකස් කිරීම.

ගරු ප්‍රා.ස.ම. රමනි හල්පෙ ගමගේ මැතිතුමිය එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අපි මෙම මාර්ග තාක්ෂණික නිලධාරී හරහා ඇස්තමේන්තු සකස් කර සහා අරමුදල් යොදවා මෝටර් ග්‍රේඩර් කර දෙන්නම්.

වරාපිටිය 14 කලාපය තුළ ඉදිරිපත් කර ඇති මාර්ග සහා අරමුදල් යොදවා මෝටර් ග්‍රේඩර් කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## <u>05 – 8. හොරේවෙල අගලබඩ ඉලුක්කැටියහේන මාර්ගය මෝටර් ග්‍රේඩර් කිරීම හා සිලින්ඩර් යෙදීම.</u>

**<u>ගරු ප්‍රා.ස.ම. රමනි හල්පෙ ගමගේ මැතිතුමිය.</u>**

හොරේවෙල අගලබඩ ඉලුක්කැටියහේන මාර්ගයේ ගමන් කිරීමට අපහසු බැවින් එම මාර්ගය මෝටර් ග්‍රේඩර් කර සිරිසේන මහතාගේ නිවස අසලින් ඇති ආරට සිලින්ඩර් යොදා එම මාර්ගය සකස් කර දෙන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. අයි. කේ. සුසන්ත පද්මතිලක් මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අපි මෙම මාර්ගය පිළිබඳ තාක්ෂණික නිලධාරී හරහා ස්ථානීය පරීක්ෂණයක් සිදු කර මාර්ගය මෝටර් ග්‍රේඩර් කිරීමට හා සිලින්ඩර් යෙදීමට අවශ්‍ය ස්ථාන පිළිබඳ ඇස්තමේන්තු සකස් කර සහා අරමුදල් යොදවා සකස් කර දෙන්නම්.

හොරේවෙල අගලබඩ ඉලුක්කැටියහේන මාර්ගය සහා අරමුදල් යොදවා මෝටර් ග්‍රේඩර් කිරීම හා සිලින්ඩර් යෙදීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 05 – 9. හොරේවෙල කොට්ඨාසයේ රත්නපුර මාමාගේ නිවස අසල මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් කිරීම හා සිලින්ඩර් යෙදීම.

**ගරු ප්‍රා.ස.ම. රමනි හල්පෙ ගමගේ මැතිතුමිය.**

හොරේවෙල කොට්ඨාසයේ රත්නපුර මාමාගේ නිවස අසල හොරේවෙල ප්‍රධාන මාර්ගයේ තිබූ මඩ වගුර සභාව විසින් ඉවත් කර දුන්නා. ඒ පිළිබඳ ස්තුතිය ප්‍රකාශ කරන අතර, එම මඩ වගුර ළඟ සිට අඩි 25 ක් පමණ දුර මාර්ගය කොන්ක්‍රීට් කර නොමැත. එම නිසා මෙම ස්ථානය පරික්ෂා කර බලා එම කොටස කොන්ක්‍රීට් කර දෙන ලෙසත්, එම ස්ථානයේ ඇති සිලින්ඩර් දෙක මතුපිට පැති බැම්ම සකස් කර දෙන ලෙසත් යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ. ටී. ශාන්ත මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපි මේ පිළිබඳ ස්ථානීය පරීක්ෂණයක් සිදු කර තාක්ෂණික නිලධාරී මඟින් මාර්ග කොන්ක්‍රීට් කිරීමට හා සිලින්ඩර් සඳහා පැති බැම් බැඳීමට ඇස්තමේන්තු සකස් කර ඒ සඳහා ප්‍රතිපාද වෙන් කර ගන්න කටයුතු සිදු කරමු. ප්‍රතිපාදන ලබා ගත් පසු අවශ්‍ය කටයුතු සිදු කරමු.

හොරේවෙල කොට්ඨාසයේ රත්නපුර මාමාගේ නිවස අසල මාර්ගයේ කොටසක් කොන්ක්‍රීට් කිරීම හා සිලින්ඩර් යොදා ඇති ස්ථානයේ පැති බැම් බැඳීම සඳහා තාක්ෂණික නිලධාරී හරහා ඇස්තමේන්තු සකස් කිරීමටත්, ඒ අනුව අවශ්‍ය මන්ත්‍රී ප්‍රතිපාදන ලබාගත් පසු අදාළ ඉදිකිරීම් සිදු කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 10. මහජන බැංකු ස්වයං බැංකු ඒකකය ස්ථාපිත කිරීම.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මිද්දෙනිය මහජන බැංකුව පවත්වාගෙන යනු ලබන ස්ථානයේ ඉදිරිපිට මිදුලෙහි මහජන බැංකුව මඟින් ස්වයං බැංකු ඒකකය ස්ථාපිත කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස ඉල්ලා ඇත. ඒ සඳහා මෙම මහජන බැංකුව ඉදිරිපිට මිදුල ලබා දෙන ලෙස ඉල්ලීමක් සිදු කර ඇත. මෙහිදී අපගේ පොදු අවශ්‍යතා සඳහා නගරය තුළ ඇත්තේ මෙම භූමි ප්‍රදේශය පමණකි. එබැවින් මෙම ස්ථානය පිළිබඳ පරික්ෂා කර බලා අදාළ සේවාව ක්‍රියාත්මක කිරීම සඳහා එම භූමියේ වෙනත් ස්ථානයක් ලබා දීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. එච්. ඒ . ගාමිණී සංජීව මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්. එච්. ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා.**

අපිට රැස්වීමක් පවත්වන්න තිබෙන්නෙත් මෙම ස්ථානය පමණයි. එම නිසා බැංකුව සමඟ කතා කර ඉදිරිපිට භූමිය නැතිව අයිනට වෙන්න ස්ථානයක් ලබා දෙන්න.

**ගරු ප්‍රා.ස.ම. ඒ. පී. නිශාන්ත කුමාර මැතිතුමා.**

ස්වයං බැංකු සේවාව හොඳයි. නමුත් මෙම බැංකුව ඉදිරිපිට භූමිය ලබා දීම සම්බන්ධව නැවත සළකා බැලිය යුතුයි.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්. ඩී. එම්. ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.**

වාණිජ , මුල්‍ය නගරයක් වන මිද්දෙනිය නගරයට මෙම සේවාව ක්‍රියාත්මක කිරීම සඳහා අපි මහජන බැංකුවට ස්ථානයක් ලබා දිය යුතුයි. මෙම සේවාව ලංකා බැංකුවෙත් තියනවා. අපි මේ සඳහා අවසර ලබා නොදෙන්නේ නම් සභාව මේ සඳහා විරුද්ධ වුණා කියන මතය ජනතාව අතරට යනවා. ඉඩකඩ අවම නිසා ඉඩ ඇහිරෙන්නෙ නැති ලෙස කොහේ හෝ ස්ථානයක් ඔවුන්ට ලබා දෙන්න. අපිට ආසන්නයේ තිබෙන කඩ කාමර සමඟ කතා කර කඩ කාමරයක් හෝ ලබා දෙන්න අවශ්‍ය වෙනසක් කර ගන්න බැරිද?

**ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා.**

ඔවුන් මේ සඳහා කොපමණ භූමි ප්‍රමාණයක් ඉල්ලනවාද? ප්‍රධාන පාර පැත්තට වෙන්න තැනක් ලබා දෙන්න බැරිවෙයිද? ඔවුන් හොඳ දෙයක් කරන්නෙ. උඩ තට්ටුවෙන් හරි කාමරයක් දෙන්න බලන්න.

**ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා.**

ඔවුන් බැංකුවෙන් දුරට වෙන ස්ථානයක මෙම සේවාව ඉදි කරන්න කැමති වෙන එකක් නැහැ. මුදල්වල ආරක්ෂාව තහවුරු වෙන්නත් ඕන. ඒ නිසා අපි ස්ථානීය පරීක්ෂණයක් සිදු කරමු.

**ගරු ප්‍රා.ස.ම ජේ. ඒ. ගාමිණී මැතිතුමා.**

මේ සඳහා අපි අවසර ලබා දෙමු. මෙම ස්ථානය ලබා දෙනව නම් ඔවුන් සවි කරන ලද කණුවත් ගලවනවා කිව්වා. සභාවටත් ආදායමක් එනවා. ඇත්තටම එතන සිදු වන්නේ ස්වයං බැංකු ඒකකය සහිත කන්ටේනර් පෙට්ටියක් ගෙනත් සවි කිරීමයි.

**ගරු ප්‍රා. ස. ම. සුගත් සරඹගේ මැතිතුමා.**

බැංකුව අතුළෙම මෙම සේවාව පවත්වා ගෙන යන්න පුළුවන්. වලස්මුල්ල මහජන බැංකුව බැංකුව තුළම ස්වයං බැංකු සේවාව ක්‍රියාත්මක කරනවා.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද තිබෙන නවීන තාක්ෂණය අනුව අපි මෙම සේවාව ක්‍රියාත්මක කිරීම සඳහා අවසර ලබා දෙන්න ඕන. නමුත් අපිට මිද්දෙනිය නගරයේ පොදු ස්ථානයකට තිබෙන්නෙත් මේ ස්ථානය පමණයි. වලස්මුල්ල නගරයේ ඇති මහජන බැංකුවේ භූමිය ඔවුන්ගේ. ඒ නිසා ඔවුන්ට ගැටළුවක් නැහැ. නගරයේ දියුණුව අවශ්‍යයි. අපි අකමැති වුණොත් නගරයේ දියුණුවට අපි හරස් වුණා වගේ වෙනවා. මොවුන් අඩි 18 * 20 ප්‍රමාණයක් ඉඩක් ඉල්ලනවා. එම නිසා භූමිය මැදින් දෙන්න බැහැ. මෙහිදී මෙම ඉඩ ප්‍රමාණය

ලබා දෙනවනම් අපි කඩ කාමරයක් කුලී පදනම මත ලබා දෙන ලෙස ස්ථානය ලබා දෙන්න වෙනවා. එහිදී මාසික බදු කුලියක් තක්සේරු කර එක්වන් මුදලක් ලබා ගෙන ගිවිසුම් ගත වී ලබා දීම සිදු කරමු. අපි තාක්ෂණික නිලධාරී සමඟ ස්ථානීය පරීක්ෂණයක් සිදු කර, බැංකුව සමඟ සාකච්ඡා කර භූමියේ පැත්තකට වෙන්න ඉඩක් ලබා දෙන්න කටයුතු සිදු කරමු.

මහජන බැංකු ස්වයං බැංකු ඒකකය ස්ථාපිත කිරීම සඳහා අදාළ ස්ථානය පරීක්ෂා කර, බැංකුව සමඟ සාකච්ඡා කර අවශ්‍ය භූමි ප්‍රමාණය කඩ කාමරයක් කුලී පදනම මත ලබා දෙන මෙන් ලබා දීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 11. මිද්දෙනිය බස්නැවතුම්පොළ උඩු මහළ අංක 10 කඩ කාමරය සම්බන්ධව.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මිද්දෙනිය බස්නැවතුම්පොළ උඩු මහළ අංක 10 කඩ කාමරය අයි. ජී. පත්මසිරි යන අයට අයත්ව ඇති අතර , නමුත් ඔහුට ඇති ආර්ථික අපහසුතා නිසා මෙම කඩ කාමරය පවත්වා ගෙන යාමට නොහැකි බැවින් අජිත් කුමාර යන අයට පවරා දෙන ලෙස 2018.08.07 දිනැති ලිපිය මඟින් දැනුම් දී ඇත. එමෙන්ම මෙම කඩ කාමරය අජිත් කුමාර යන අයට පවරා දෙන මෙන් 2018.08.07 දිනැති ඉල්ලීම් ලිපිය මඟින් ඔහු ඉල්ලීම් කර ඇත. මෙම ඉල්ලීම් ලිපි අනුව මිද්දෙනිය බස්නැවතුම්පොළ උඩු මහළ අංක 10 කඩ කාමරය අජිත් කුමර යන අයට චක්‍රලේඛ අනුව පවරා දීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ. ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම. එම්. සිරිසේන මැතිතුමා.**

මොවුන්ගේ ඉල්ලීම් ලිපි හා දිවුරුම් ප්‍රකාශ අතර වෙනසක් තියනවා. ඒ නිසා මෙම කඩ කාමරය පවරා දීම පිළිබඳ විශේෂයෙන් සැලකිළිමත් වෙන්න ඕන.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්. ඩී. එම්. ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.**

අපි කොහොමත් චක්‍රලේඛ අනුව පවරා දීම කරනු ලබන නිසා ගැටළුවක් වන එකක් නැහැ. පවරනු ලබන තැනැත්තා අනුව ඉදිරියට අය කිරීම් කරනවා.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපි මෙම මිද්දෙනිය බස්නැවතුම්පොළ අංක 10 කඩකාමරය චක්‍රලේඛ අනුව අජිත් කුමාර මහතාට පවරා දීම සිදු කරමු.

මිද්දෙනිය බස්නැවතුම්පොළ උඩු මහළ අංක 10 කඩ කාමරය අජිත් කුමාර යන අයට චක්‍රලේඛ අනුව පවරා දීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 12. උඩ අළුපොත්දෙනිය පොදු වෙළඳ පොළට කඩ කාමර ලබා ගැනීම.

**ගරු ප්‍රා.ස.ම. ඒ. පී. නිශාන්ත කුමාර මැතිතුමා.**

උඩ අළුපොත්දෙනිය පොදු වෙළඳ පොළෙහි වැසි දිනවල වතුර පිරෙන නිසා වෙළඳාම් කටයුතු කිරීමට අපහසු වේ. එම නිසා මෙම පොළ සඳහා කඩ කාමර 06 ක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් සකස් කර දී පොළ සංවර්ධනය කරන ලෙස යෝජනා කරමි.

ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම. එම්. සිරිසේන මැතිතුමා.**

ජූලි මස මෙම පොළෙහි ආදායම රු. 2270.00 ක් ලැබිලා තිබෙනවා. කටුවන තොග පොළටත් වෙළෙන්දන් එන්නෙ නැහැ. මෙම ප්‍රදේශයට ආසන්නව ගොමඩිය පොළ තිබෙනවා. මෙම පොළ තිබෙන ඉඩම පිළිබඳ සොයා බලන්න. අළුපොත්දෙනිය පොලේ ආදායමත් අඩුයි. වෙළෙන්දන් ප්‍රමාණයත් අඩුයි. මෙම පොළ සංවර්ධනය කිරීම හොඳ යෝජනාවක්. නමුත් අවශ්‍යතාවය අනුව ප්‍රමුඛතාවය දෙමු.

**ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා.**

ප්‍රදේශයේ සංවර්ධනය හදන්නෙ නැතිව පොළට මිනිස්සු එන්නෙ නැහැ. එම නිසා මෙය හොඳ යෝජනාවක්. පොළ ප්‍රමිතියට හැදු විට වෙළෙන්දන් ප්‍රමාණය වැඩි වෙන්න පුළුවන්.

**ගරු ප්‍රා.ස.ම. එම්. ඩී. සුගතදාස මැතිතුමා.**

පොළ සංවර්ධනය සමඟ කඩ කාමර ඉදි කරන්න කියලා ඉල්ලීම් කර තිබෙනවා. එම ඉඩමේ අයිතිය පිළිබඳ සොයා බලන්න.

**ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා.**

දියුණු වෙමින් පවතින ප්‍රදේශයක්. ප්‍රාදේශීය ලේකම් සතුව මෙම ඉඩම පවතිනවා. දැන් තිබෙන තත්ත්වය අනුව පොළ පවත්වන්න බැහැ. ඒ නිසා පොළ සංවර්ධනය කරමු.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මෙම පොළ පවත්වන ඉඩම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය සතු ඉඩමක්. නමුත් අපිට පොළ පවත්වන්න ඉඩම ලබා දී තිබෙනවා. පොළෙහි වෙළඳාම් කරන්න අපහසු නිසා වෙළෙන්දන් එන්නෙ නැහැ. ඒ නිසා ආදායමත් අඩුයි. මේ කාලයේ ගම තුළට ගිහින් වෙළඳුන් නිෂ්පාදන ලබා ගන්නා නිසා තොග පොළවලට ලැබෙන නිෂ්පාදන ප්‍රමාණය අඩුයි. එබැවින් ආදායම අඩු වෙලා. අපි මේ පොළ හදන්න ඕන. නමුත් පොළ සකස් කිරීමට ප්‍රමාණවත් සභා අරමුදල් නැහැ. ඒ වෙනුවෙන් මන්ත්‍රී ප්‍රතිපාදන

වෙන් කර ගන්න ඕන. එම නිසා මේ පිළිබඳ තාක්ෂණික නිලධාරී හරහා ඇස්තමේන්තු සකස් කර අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගෙන පොළ සංවර්ධනය කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ. ටී. ශාන්ත මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. ප්‍රතිපාදන වෙන් කර ගන්න කටයුතු කරමු.

තාක්ෂණික නිලධාරී මඟින් ඇස්තමේන්තු සකස් කර ඒ සඳහා අවශ්‍ය මන්ත්‍රී ප්‍රතිපාදන ලබා ගෙන උඩ අළුපොත්දෙනිය පොළ සංවර්ධනය කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>05 – 13. මිද්දෙනිය ශ්‍රී මහින්ද නාහිමි මාවත සඳහා නළ ළිඳක් ලබා දීම සම්බන්ධව.</u>

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

සභාව සතු ජල ව්‍යාපෘතිය මඟින් වතුර සපයන මිද්දෙනිය ශ්‍රී මහින්ද නාහිමි මාවතේ පදිංචි පවුල් 25 ක් 30 ක් පමණ ප්‍රමාණයකට වතුර නොලැබෙන බව දන්වා ඇත. එබැවින් බොහෝ දුර ප්‍රදේශවලින් මුදලට හා නළ ළිංවලින් ජලය ලබා ගැනීම ඉතාම දුෂ්කර වී ඇත. එම නිසා මෙම ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ප්‍රතිපාදන ලබා ගෙන ජල ධාරිතාව පිළිබඳ ජල සම්පාදන මණ්ඩලය මඟින් පරීක්ෂා කරවා නළ ළිඳ ඉදි කර දීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ. ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා.</u>**

අපි ජල ව්‍යාපෘතිය මඟින් එම ප්‍රදේශයට වතුර ලබා දෙනවා. නමුත් එම ප්‍රදේශවලට වතුර ලැබෙන්නෙ නැද්ද? එසේ නම් සභාවට ඒ වෙනුවෙන් කරන්න පුළුවන් දෙයක් තිබේ නම් කරමු.

**<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්. ඩී. එම්. ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.</u>**

අපේ ජල ව්‍යාපෘතියෙන් ජලය ලබා දුන්නද කන්ද මුදුන ප්‍රදේශයට වතුර වදිනවා අඩුයි. මේ ගෙවල්වලට දවස් තුනකට හෝ හතරකට වරක් වතුර වදින්නෙ. නළ ළිඳක් තිබෙනව නම් ගොඩක් හොඳයි. වියළි කාළගුණය සමඟ ජල ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු ද වැඩි නිසා නළ ළිං සකස් කිරීමට ප්‍රතිපාදන ප්‍රමාණවත් නැතිව ඇති. එම නිසා මේ පිළිබඳ ජල සම්පාදන මණ්ඩලය හරහා පරීක්ෂා කර බලා ඇස්තමේන්තුවක් සකස් කර දෙන්න. අපිට ප්‍රතිපාදන වෙන් කර ගන්න උත්සහා කරන්න. මීට අමතරව හඳුනා ගත් ස්ථාන කිහිපයකට නළ ළිං ඉදිකිරීමේ අවශ්‍යතාවය තියනවා.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අපිට මේ සඳහා ප්‍රතිපාදන නැහැ. නමුත් ජල සම්පාදන මණ්ඩලය හරහා භූගත ජලය පිළිබඳ පරීක්ෂා කර ඇස්තමෙන්තුවක් සකස් කරමු. ඒ අනුව අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ගෙන ඉදිකිරීම් සිදු

කරමු. මහින්ද නාහිමි මාවතේ අපේ නළ ළිඳක් තියනවා. එය ශුද්ධ කර වතුර ගන්න විට බිබුලෙ වතුර අඩුවෙනවා. ඒ නිසා හැම තැනම නළ ළිං ඉදිකිරීමේ ගැටළුවක් තියනවා.

මිද්දෙනිය ශ්‍රී මහින්ද නාහිමි මාවත සඳහා ජල සම්පාදන මණ්ඩලය හරහා භූගත ජලය පිළිබඳ පරික්ෂා කර ඇස්තමේන්තුවක් සකස් කර ප්‍රතිපාදන වෙන් කර ගෙන නළ ළිඳක් ඉදිකර දීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>05 – 14. දෙහිගහහේන ජංගම ආයුර්වේද වෛද්‍ය සායනය ආරම්භ කිරීම.</u>

<u>**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**</u>

දෙහිගහහේන ප්‍රදේශයේ ජංගම ආයුර්වේද මධ්‍යස්ථාන සායනයක් පවත්වා ගෙන යාම සඳහා පෙර සභා වාරයකදී අපි අනුමැතියක් ලබා ගත්තා. එහිදී මේ පිළිබඳ වෛද්‍යවරයා සමඟ සාකච්ඡා කළ අතර, එම සායන මධ්‍යස්ථානය සඳහා පහත සඳහන් පහසුකම් ලබා දෙන ලෙස ඉල්ලා සිටින ලදි. එහිදී මෙම පහසුකම් සැපයීම ලක්ෂ නවයකට වැඩි පිරිවැයක් දැරීමට සිදු වන අතර, ඒ සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන මෙම වසරේ අය වැයෙන් වෙන් කර නොමැත. එම නිසා 2019 අය වැයෙන් ප්‍රතිපාදන වෙන් කර අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගෙන දෙහිගහහේන ආයුර්වේද වෛද්‍ය සායන මධ්‍යස්ථානය ආරම්භ කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

<u>**දළ වියදම් ඇස්තමේන්තුව.**</u>

| අනු අංකය | භාණ්ඩ වර්ගය | ඒකක ගණන | වටිනාකම ( රු ) |
|---|---|---|---|
| 01 | රුධිර පීඩන මානය | 01 | 5500.00 |
| 02 | වෙද නලාව | 01 | 15000.00 |
| 03 | උස මැනීමේ උපකරණය | 01 | 550.00 |
| 04 | බර මැනීමේ උපකරණය | 01 | 1800.00 |
| 05 | රුධිරයේ සීනි මැනීමේ උපරණය | 01 | 6500.00 |
| 06 | මිනුම් සරා | 04 | 1000.00 |
| 07 | ඉලෙක්ට්‍රෝනික තරාදි | 01 | 1800.00 |
| 08 | මේස | 03 | 55000.00 |
| 09 | වෛද්‍යවරයා සඳහා පුටුවක් | 01 | 15000.00 |
| 10 | රෝගියා සඳහා පුටුවක් | 01 | 4000.00 |
| 11 | ප්ලාස්ටික් පුටු | 20 | 26000.00 |
| 12 | රාක්ක සකස් කිරීම | - | 100000.00 |
| 13 | පොලිතින්, ඉටිපන්දම්, ගිනිපෙට්ටි | මාසයකට 2000 බැගින් මාස 12 | 24000.00 |
| 14 | ඖෂධ සඳහා | මසකට රු. 60000.00 බැගින් මාස 12 කට | 720000.00 |
| මුළු පිරිවැය | | | 976150.00 |

ගරු ප්‍රා.ස.ම. මානෙල් දිසානායක මැතිතුමිය ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා.**

මෙම ආයුර්වේද මධ්‍යස්ථානය ආරම්භ කිරීම මඟින් ගම්මාන කිහිපයක විශාල ජනතාවකට සේවය සැලසෙනවා. මේ සඳහා මගේ නිවස නොමිලේ ලබා දී තිබුණා. මීට පෙර වෛද්‍යවරියට ගමන් පහසුකම් නොමැති නිසා අතරමග නතර වුණා. නමුත් මෙවර පහසුකම් ලබා දෙනව නම් ආයුර්වේද මධ්‍යස්ථානය පවත්වා ගෙන යාමේ ගැටළුවක් ඇති වෙන එකක් නැහැ.

**ගරු ප්‍රා.ස.ම. එම්. සිරිසේන මැතිතුමා.**

මීට පෙරත් කටුවන හා දෙහිගහහේන යන ස්ථාන දෙකෙහි පවත්වා ගෙන ගිය ආයුර්වේද මධ්‍යස්ථාන දෙකම වැහෙන්න හේතුව කුමක්ද? මින් ඉදිරියටත් විශාල පිරිවැයක් දරලා ස්ථිර උපකරණ අරගෙන අතර මගදි වැහැව්වොත් වැඩක් නැහැ. ඒ නිසා අඛණ්ඩව පවත්වා ගෙන යන තැනට වැඩ කළ යුතුයි.

**ගරු ප්‍රා.ස.ම. ජේ. ඒ. ශාන්ත මැතිතුමා.**

ප්‍රවාහන පහසුකම් ලබා නොදුන් නිසා පෙර ආයුර්වේද මධ්‍යස්ථානය වැහුණා. අපේ කලාපයේ ගම්මානවල ජනතාව මෙම මධ්‍යස්ථානය සඳහා ඖෂධ ලබා ගැනීමට පැමිණෙනවා. වරාපිටිය ප්‍රදේශයෙත් ජංගම ආයුර්වේද සේවාව ක්‍රියාත්මක වෙනවා නම් හොඳයි.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්. ඩී. එම්. ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.**

මේ සඳහා විශාල පිරිවැයක් දැරීමට සිදු වන නිසා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට යොමු කර ප්‍රතිපාදන ලබා ගෙන ක්‍රියාත්මක කරන්න තීරණයක් ගත්තා නම් හොඳයි. දේශීය වෙදකමට අවධානය යොමු කිරීම ගොඩක් හොඳයි. ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට දාලා ප්‍රතිපාදන ගන්න උත්සහ කරන්න. ආයුර්වේද දෙපාර්තමේන්තුව හරහා ඉල්ලීම් කරන්න බැරිද?

**ගරු ප්‍රා.ස.ම. සුගත් සරඹගේ මැතිතුමා.**

ඉංග්‍රීසි බෙහෙත්වල බරපතල ගැටළු තියනවා. එබැවින් තවදුරටත් සිංහල වෙදකම ව්‍යාප්ත වෙනව නම් හොඳයි.

**ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා.**

අත්‍යවශ්‍යම උපකරණ ටික අරගෙන දීලා අවම වියදමකින් ආරම්භ කරමු.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මීට පෙර අපිට වෛද්‍යවරියක් සිටියා. මේ කඳු සහිත ප්‍රදේශයට එතුමියට යැම හා ඒම ගැටළුවක් වුණා. ඒ නිසා අතරමග මෙම මධ්‍යස්ථානය වහන්න සිදු වුණා. නමුත් ඉදිරියේදී අපිට ප්‍රවාහන පහසුකම්

සපයා දී මෙම ජංගම සේවය නොකඩවා ක්‍රියාත්මක කරන්න පුළුවන්. මේ පිළිබඳ මම සම්බන්ධීරණ කමිටුවේදීත් කතා කළා. නමුත් මෙම වැඩසටහන් සඳහා ලබා දෙන්න ප්‍රතිපාදන නැහැ කිව්වා.

දෙපාර්තමේන්තුවෙන් අපිට වාර්ෂිකව ඖෂධ ලබා ගැනීමට ලබා දෙන ප්‍රතිපාදනවත් තවම ලබා දී නැහැ. කිරම ආයුර්වේද මධ්‍යස්ථානය සඳහා මේ වන විට ලක්ෂ 05 ට වැඩි ප්‍රමාණයක ඖෂධ ලබා දී තිබෙනවා. එම නිසා ලබන වර්ෂයේ ප්‍රතිපාදන වෙන් කර ගෙන අවශ්‍ය උපකරණ හා ඖෂධ ලබා ගෙන දෙහිගහහේන ජංගම ආයුර්වේද වෛද්‍ය සායනය ආරම්භ කරමු.

2019 වර්ෂයේ අය වැය මඟින් ප්‍රතිපාදන වෙන් කර ගෙන අවශ්‍ය උපකරණ හා ඖෂධ ලබා ගෙන දෙහිගහහේන ජංගම ආයුර්වේද මධ්‍යස්ථානය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 05 – 15. ප්‍රින්ටර් සඳහා සේවා ගිවිසුමක් යටතේ සේවය ලබා ගැනීම.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අප සභාවේ මුද්‍රණ කටයුතු සිදු කරන ප්‍රින්ටර් අතුරින් නිතර භාවිතා කරන ප්‍රින්ටර් කිහිපයකි. එම ප්‍රින්ටර් මඟින් ලබා ගන්නා පිටපත් ප්‍රමාණය අධික වීම හේතුවෙන් නිතර නිතර අක්‍රිය තත්ත්වයට පත්වේ. තවද කොටස් ගෙවී යාම හා කැඩී යාම නිසා කාර්යාලය තුලදී මේවා අළුත්වැඩියා කටයුතු සිදු කිරීම අසීරු වේ. එබැවින් මෙම ප්‍රින්ටර් තුළින් අඛණ්ඩ සේවා සැපයීමක් ලබා ගැනීමට නම් මෙම යන්ත්‍ර සේවා කිරීම සඳහා සුදුසු සේවා නියෝජිත ආයතනයක් සමඟ ගිවිසුම්ගත වී ඔවුන්ගේ සේවාව ලබා ගැනීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. පී. කොඩිතුවක්කු මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම. එම්. ඩී. සුගතදාස මැතිතුමා.**

අපි ගිය සභා වාරයකදි මැෂින් දෙකක් ගන්න සභා අනුමැතියක් ලබා ගත්තා නේද?

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපි ගිය සභා වාරයේදී ඡායා පිටපත් යන්ත්‍ර දෙකක් ලබා ගන්න සභා අනුමැතියක් ගත්තා. ඒ සඳහා මේ වන විට මිළ කැඳවීම් කර තිබෙනවා. මෙම තිබෙන ප්‍රින්ටර් අළුත්වැඩියා කිරීම සඳහා සුදුසු සේවා නියෝජිත ආයතනයක් සමඟ ගිවිසුම්ගත වී ඔවුන්ගෙන් අදාළ සේවාව ලබා ගනිමු.

සභාව සතු මුද්‍රණ යන්ත්‍ර සඳහා සුදුසු සේවා නියෝජිත ආයතනයක් සමඟ ගිවිසුම්ගත වී ඔවුන්ගෙන් එම සේවාව සිදු කර ගැනීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06. කාරක සභා යෝජනා.

## 06 - අ ). මුදල් හා ප්‍රතිපත්ති සැකසුම් කමිටු වාර්තාව - 2018 අගෝස්තු මස.

### ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.

2018 අගොස්තු මස 09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ පහත සඳහන් අංක 01 සිට 85 දක්වා වවුචර් සඳහා ගෙවීම් කිරීමට හා එම කමිටුව විසින් නිර්දේශ කර ඇති අංක 01 සිට 04 දක්වා යෝජනා ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි යොජනා කරමි.

| අනු අංකය | නම | විස්තරය | මුදල (රු.) |
|---|---|---|---|
| 01 | සුප්පා වඩිවෙල් මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස අතිකාල | 8000.00 |
| 02 | එස්.බී.ඒ.සිරිල් මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස අතිකාල | 481.00 |
| 03 | කේ.කේ.නාලක මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 මැයි මස අතිකාල | 2286.18 |
| 04 | කේ.කේ.නාලක මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස අතිකාල | 3165.48 |
| 05 | ආරියරත්න මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 මැයි මස අතිකාල | 2128.00 |
| 06 | ආරියරත්න මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස අතිකාල | 1460.00 |
| 07 | අයි.විමලාවතී මිය<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස අතිකාල | 3255.00 |
| 08 | අයි.විමලාවතී මිය<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 මැයි මස අතිකාල | 709.00 |
| 09 | කේ.වී.පතිනායක මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 මැයි මස අතිකාල | 2086.00 |
| 10 | කේ.වී.පතිනායක මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස අතිකාල | 2837.00 |
| 11 | සුජිත් ලක්මාල් මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස අතිකාල | 2164.00 |
| 12 | ආර්.ජේ.ගුණසේකර මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස අතිකාල | 5850.00 |
| 13 | කේ.කේ.රංජනී මිය<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස අතිකාල | 1669.00 |
| 14 | කේ.රූපසේන මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස අතිකාල | 4341.00 |
| 15 | රොෂාන් ඉන්ද්‍රජිත් මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස අතිකාල | 6612.00 |
| 16 | ප්‍රභාත් ජානක සම්පත් මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස අතිකාල | 3647.00 |
| 17 | ඒ.වසන්ත මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස අතිකාල | 4917.00 |
| 18 | ඩබ්.ඒ.කේ.ධර්මදාස මයා | 2018 ජුනි මස අතිකාල | |

| | | | |
|---|---|---|---|
| | කටුවන ප්‍රාදේශීය සභාව | | 8330.00 |
| 19 | කුමාර පලිහක්කාර මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස අතිකාල | 5578.00 |
| 20 | ඒ.කේ.ඒ.ක්‍රිෂාන්ත මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස අතිකාල | 1011.00 |
| 21 | කේ.ටී.එම්.රුචිර ප්‍රියංකර මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස අතිකාල | 1822.00 |
| 22 | ඩබ්.පී.ආර්.ධර්මරාජික මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස අතිකාල | 6343.00 |
| 23 | ජී.එම්.නිහාල් චමින්ද මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස අතිකාල | 6588.00 |
| 24 | නන්දන කරුණාතිලක මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස අතිකාල | 7034.00 |
| 25 | එච්.ඒ.එම්.ඥානවතී මිය<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජනවාරි මස අතිකාල | 667.00 |
| 26 | එස්.දුෂාන්ති මිය<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස පරිවර්තන ගමන් වියදම් | 905.00 |
| 27 | එස්.කේ.අබේවික්‍රම මිය<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස පරිවර්තන ගමන් වියදම් | 3000.00 |
| 28 | ආර්.ජී.සමන් මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 1192.00 |
| 29 | අයි.ජී.බුද්ධිකා රුවන්ති මිය<br>කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 1275.00 |
| 30 | ගරු සභාපති අයි.ජී.මහින්ද මැතිතුමා | ගමන් වියදම් | 7750.00 |
| 31 | එන්.ඩී.කරුණාතිලක මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 7700.00 |
| 32 | ඩබ්.ඒ.ප්‍රසාද් චතුරංග මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 2570.00 |
| 33 | ප්‍රියන්ත ඒකනායක මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 මැයි මස අතිකාල | 1099.00 |
| 34 | එච්.ඒ.එම්.ඥානවතී මිය<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 පෙබරවාරි මස අතිකාල | 709.00 |
| 35 | එච්.ඒ.එම්.ඥානවතී මිය<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 මාර්තු මස අතිකාල | 2712.00 |
| 36 | ඊ.ඒ.එන්.රණතුංග මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුලි මස පරිවර්තන ගමන් වියදම් | 1660.00 |
| 37 | එම්.කේ.ටී චතුරිකා මිය<br>කටුවන ප්‍රාදේශීය සභාව | 2018 ජුනි මස පරිවර්තන ගමන් වියදම් | 911.00 |
| 38 | ජෝන් කීල්ස් ඔෆිස් ඔටෝමේෂන් ප්‍රයිවට් ලිමිටඩ් යූනියන් පෙදෙස, කොළඹ 02. | සභාව සතු PC 31717 අංක දරණ ෆොටෝ කොපි යන්ත්‍රය අළුත් වැඩියා කිරීම | 24667.50 |
| 39 | මාතර හාඩ්වෙයාර් ස්ටෝර්ස් කටුවන පාර, මිද්දෙනිය | පිස්සුබැද්ද පොළෙහි කම්බි කණුවල කටු කම්බි තද කිරීමට අවශ්‍ය කරන කම්බි කූරු ලබා ගැනීම | 510.00 |
| 40 | ජී.සමීර මධුශංක මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 2100.00 |

| | | | |
|---|---|---|---|
| 41 | කේ.එච්.ලලනි දේවිකා මිය කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 1643.00 |
| 42 | ඒ.පී.ඩී.චතුරංග මයා අරලිය හොටෙල්,බස් නැවතුම්පල පිටුපස, මිද්දෙනිය. | 2018.06.21 වන දින පැවැත්වූ සභා රැස්වීමේ මහජන නියෝජිතයින්ට අවශ්‍ය උදෑසන තේ සහ දිවා ආහාරය සැපයීම (චිකන් රයිස් 40, සැන්විච් 50,වතුර බෝතල් 48, පුවාලු කෙසෙල් 04kg) | 15700.00 |
| 43 | අමිල එම්බ්‍රොයිඩර් පනාමුර පාර, මිද්දෙනිය. | කටුවන ප්‍රාදේශීය සභාවේ සේවය කරන නිළ ඇඳුම් හිමි නිලධාරීන් හා සේවකයින්ට නිළ ඇඳුම් සඳහා අවශ්‍ය රෙදි ලබා දීම ( තාක්ෂණ නිලධාරී,ආදායම් පරීක්ෂක,සෞඛ්‍ය කම්කරුවන්,මුරකරුවන්, රෙදි මීටර් 180) | 47700.00 |
| 44 | කමල් ධර්මජිත් සමරසිංහ මයා සමරසිංහ මෙටල් ක්‍රෂර්,තලාව, කාරියමඩිත්ත. | කටුවන පොළ භූමියට යෙදීමට ABC ගල් කුඩු මිශ්‍රණ ලබා ගැනීම | 1700.00 |
| 45 | යූ.එස්.බී.කමියුනිකේෂන් 02කණුව,පනාමුර පාර, ඇඹිලිපිටිය | කටුවන ප්‍රාදේශීය සභා මිද්දෙනිය උප කාර්යාලයේ CCTV කැමරා පද්ධතිය සවි කිරීම | 85800.00 |
| 46 | එල්.ඩී.ස්ටෝර්ස් වීරකැටිය පාර, මිද්දෙනිය | 2018.07.10 වන දින මිද්දෙනිය සභා කාර්යාලයේ පැවැත්වුණු සේවක රැස්වීමට සහභාගී වූ පිරිසට තේ පැන් සංග්‍රහයට අවශ්‍ය චොකලට් බිස්කට් 02 kg ලබා ගැනීම | 750.00 |
| 47 | සාමාන්‍යාධිකාරී සී/ස වීරකැටිය වි.සේ.ස සමිතිය | 2018.06.18 සිට 2018.06.29 දක්වා ඉන්ධන බිල්පත් පියවීම ( PF 7414 ඩීසල් 209 L/RC 5539 ඩීසල් 80 L/RB3498 ඩීසල් 68 L/ZA 2978 ඩීසල් 130 L/RD 4364 ඩීසල් 45 L/RE 8995 ඩීසල් 40 L/252-6508 ඩීසල් 124L/ RC 7796 ඩීසල් 35 L/SPLF7533 ඩීසල් 10L/ RD 1581 ඩීසල් 15 L/227-5870 ඩීසල් 22L/LL 6446 ඩීසල් 85 L/LK9589 ඩීසල්85 L/227-5163 ඩීසල් 80L/ | 112052.00 |
| 48 | ඩබ්.පි.මදුරංග මයා පී.සී.ටෙක්නොලජී, වලස්මුල්ල පාර,මිද්දෙනිය. | කටුවන ප්‍රාදේශීය සභාවේ කාර්යාලීය ප්‍රයෝජනය සඳහා අවශ්‍ය කරන Wi-Fi Adaptor එකක් ලබා දීම | 2200.00 |
| 49 | කේ.හෙට්ටිආරච්චි මිය "රවිඳු ස්ටෝරස්"කටුවන. | දෙවරක් ගෙවන ලද වෙළඳ බලපත්‍ර ගාස්තු වලින් එක් වරක මුදල් නිදහස් කිරීම | 825.00 |
| 50 | හේවා විතාරන මිල්ටන් මයා "මිල්ටන් ස්ටෝර්ස්" හුංගම පාර, මිද්දෙනිය. | සභාව සතු 227-5870 අංක දරණ වෑන් රථයේ උඩ හා යට ක්ලච් වොෂර් දැමීම | 900.00 |
| 51 | කේ.එස්.එස්.සී.සමරසිංහ මයා "සූරාජ් මෝටර්ස්" වලස්මුල්ල පාර, කටුවන. | සභාව සතු 227-5870 අංක දරණ වෑන් රථය සේවා කිරීම | 8110.00 |
| 52 | මාතර හාඩ්වෙයාර් ස්ටෝර්ස් කටුවන පාර, මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවට අයත් මිද්දෙනිය පොළ භූමියෙහි වැසිකිළි පද්ධතිය අළුත් වැඩියා කිරීම (සිමෙන්ති 03 kg /1/2"කරාම 02) | 466.00 |

| | | | |
|---|---|---|---|
| 53 | මාතර හාඩ්වෙයාර් ස්ටෝර්ස් කටුවන පාර, මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවේ බූකැන්දයාය ජල බලාගාරයේ ජල මෝටරය සවි කිරීමට අවශ්‍ය සිමෙන්ති 50 kg ලබා ගැනීම | 930.00 |
| 54 | මුදල් භාරකරු කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාවේ තේ පානය කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම (2017.06.19 දින සීනි 5 kg /හකුරු පැකට් 05/ කෝපි පැකට් 01/ 2017.07.11 දින සීනි 4 kg / තේ කුඩු 02 kg/ හකුරු පැකට්10 | 4560.00 |
| 55 | බෙල්කො ඔෆ්සෙට් ප්‍රින්ටර්ස් "දික්වැල්ල පාර" බෙලිඅත්ත | කටුවන ප්‍රාදේශීය සභාවේ කාර්යාලීය ප්‍රයෝජනය සඳහා අවශ්‍ය කරන ගොඩනැගිලි අයදුම්පත්‍ර 100 ක් මුද්‍රණය කිරීම | 3800.00 |
| 56 | මාතර හාඩ්වෙයාර් ස්ටෝර්ස් කටුවන පාර, මිද්දෙනිය | සභාව සතු තණකොළ මැෂිනයට අවශ්‍ය නූල් පන්දුවක් ලබා ගැනීම | 2350.00 |
| 57 | ලසිකා නිල්මිණි රණමුක මිය වරාපිටිය පාර, කටුවන | කටුවන ප්‍රාදේශීය සභාවේ 2018.06.26 දින පැවැත්වීමට යෙදුණු ඩෙංගු හා නගර පවිත්‍ර කිරීම මිද්දෙණිය, කටුවන, කිරම ක්‍රියාත්මක කල වැඩසටහන වෙනුවෙන් සහභාගී වූවන් සඳහා ආහාර හා තේ පැන් සඳහා වියදම් වු මුදල් ගෙවීම | 47600.00 |
| 58 | එන්.පී.ස්වර්ණලතා මිය පුවත්පත් නියෝජිත | 2018 ජුලි මස වරාපිටිය මහජන පුස්තකාල පුවත් පත් බිල | 6355.00 |
| 59 | එන්.පී.ස්වර්ණලතා මිය පුවත්පත් නියෝජිත | 2018 ජුලි මස කිරම මහජන පුස්තකාල පුවත් පත් බිල | 6935.00 |
| 60 | ජේ.දිලාන් මයා මිද්දෙනිය පාර, කටුවන | 2018 ජුනි මස කටුවන මහජන පුස්තකාල පුවත් පත් බිල | 6665.00 |
| 61 | මාතර හාඩ්වෙයාර් ස්ටෝර්ස් කටුවන පාර, මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභා මිද්දෙනිය උප කාර්යාලයේ බිම තීන්ත ආලේප කිරීමට අවශ්‍ය ද්‍රව්‍යයන් ලබා ගැනීම (රතු තීන්ත 01L/ කළු තීන්ත01L/ අඟල් 02 පින්සල් 01/ අඟල් 05 පින්සල් 01) | 3302.00 |
| 62 | ධම්මික ට්‍රේඩ් සෙන්ටර් වලස්මුල්ල පාර, කටුවන | සභාව සතතණකොළ මැෂිනය අළුත් වැඩියා කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම (මැෂින් ඇක්ස්ලේටර් 01/මැෂිනයේ තලය දැමීම සඳහා අවශ්‍ය ගම් සහ බෝල්ට් ඇණ සහිත කොටස් 01/මැෂිනයේ නූල දැමීමට හැකි බොබින් 01) | 1015 .00 |
| 63 | කේ.එච්.සී.එස්.අබේධීර මයා වෛද්‍ය නිලධාරී, නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාව, කිරම | 252-6508 කැබ් රථය අධිවේගී මාර්ගය භාවිතා කිරීමේදී ගෙවන ලද මුදල | 1100.00 |
| 64 | යූ.ජී.හේෂාන් චාමික මයා කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 760.00 |
| 65 | යූ.ජී.හේෂාන් චාමික මයා කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 2765.00 |
| 66 | එස්.පී.දේදුණු සඳරේඛා මෙය කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 1655.00 |
| 67 | පී.කේ.ඒ.කවිජ විරාන් මයා 96, ළිඳගාව වත්ත, වැලිපිටිය, මිද්දෙනිය. | 2018.06.26 දින පැවති ඩෙංගු හා නගර පවිත්‍රතා වැඩසටහන සඳහා JCB යන්ත්‍රයක් යොදා ගැනීම | 8400.00 |
| 68 | ටී.ඩී.නලින් දේශප්‍රිය මයා | ගමන් වියදම් | |

| | | | |
|---|---|---|---|
| | කටුවන ප්‍රාදේශීය සභාව | | 1157.00 |
| 69 | ටී.ඩී.නලින් දේශප්‍රිය මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 720.00 |
| 70 | ඩබ්.කේ.සුරංග මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 800.00 |
| 71 | අයි.ජී.බුද්ධිකා මිය<br>කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 1967.50 |
| 72 | මාතර හාඩ්වෙයාර් ස්ටෝර්ස්<br>කටුවන පාර, මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාවේ,කටුවන මහජන පුස්තකාලයේ වැසිකිළි 02 පවිත්‍ර කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම (මීටර් 100 හෝස් 01/වැසිකිළි පිරිසිදු කිරීමේ බුරුසු 04/හාර්පික් බෝතල් 07) | 3510.00 |
| 73 | සාමාන්‍යාධිකාරී සී/ස<br>වීරකැටිය වි.සේ.ස සමිතිය | 2018.06.26 සිට 2018.07.13 දක්වා ඉන්ධන බිල්පත් පියවීම (ගබඩාවට ඩීසල් 20 L/ PF 7414 ඩීසල් 304 L/ 252-6508 ඩීසල් 219 L/ ZA 2375 ඩීසල් 55 L/ 227-5870 ඩීසල් 25 L/<br><br>RB3498 ඩීසල් 63 L/ RE 8995 ඩීසල් 40 L/ RC 7796 ඩීසල්70 L/ ධූමායනය සඳහා ඩීසල්160 L/ ධූමායනය සඳහා පෙට්‍රල් 32 L/ MG 330 ඩීසල් 274 L/ MG 330 ග්‍රීස් 15KG RD 4364 ඩීසල් 35 L/ZA 2978ඩීසල් 50 L | 165905.00 |
| 74 | ටී.ඩී.නලින් දේශප්‍රිය මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 573.00 |
| 75 | එස්.ජේ.ඒ.ගුණරත්න මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | සභාව සතු SPLK 9589 අංක දරණ ටිපර් රථයේ පිටුපස රෝදයේ පැච් එකක් දැමීම (8.25X 20 ටේප් එක සඳහා 600.00 /පැච් එක සඳහා 300.00 | 900.00 |
| 76 | චමින්ද ඉලෙක්ට්‍රිකල්ස්<br>නො 33, අඹේදොලතැන්න,<br>මාකාවිට,මාතර. | කටුවන ප්‍රාදේශීය සභාවට අවශ්‍ය කරන විදුලි උපකරණ ලබා ගැනීම ( වීථි පහන් අළුත් වැඩියා සහ නඩත්තු කටයුතු සඳහා) | 1580840.0<br>0 |
| 77 | එම්.කේ.ටී.චතුරිකා මිය<br>කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 225.00 |
| 78 | කේ.එච්.සේනාරත්න මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | ගමන් වියදම් | 700.00 |
| 79 | කේ.ශිරෝමි ප්‍රියදර්ශනි මෙය<br>කටුවන ප්‍රාදේශීය සභාව | කටුවන ප්‍රාදේශීය සභාවට අයත් කිරම මහජන පුස්තකාලය හා විද්‍යුත් පුස්තකාලය මඟින් ලෝක පරිසර දිනය නිමිති කරගෙන 2018.06.13 දින කිරම ධම්මානන්ද මහා විද්‍යාලයේ පැවැත්වූ පරිසර වැඩසටහන සඳහා දරුවන් වෙනුවෙන් ත්‍යාග ලබා දීමට අදාලව වියදම් වූ මුදල් ලබා ගැනීම | 2142.50 |
| 80 | කේ.එච්.සේනාරත්න මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 252-6508 කැබ් රථය අධිවේගී මාර්ගය භාවිතා කිරීමේදී ගෙවන ලද ගාස්තු ලබා ගැනීම | 1100.00 |
| 81 | ජී.සමීර මධුශංක මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | 252-6508 කැබ් රථය අධිවේගී මාර්ගය භාවිතා කිරීමේදී ගෙවන ලද ගාස්තු ලබා ගැනීම | 400.00 |

| | | | |
|---|---|---|---|
| 82 | එන්.ඞී.කරුණාතිලක මයා<br>කටුවන ප්‍රාදේශීය සභාව | PF 7414 කැබ් රථය අධිවේගී මාර්ගය භාවිතා කිරීමේදී ගෙවන ලද ගාස්තු ලබා ගැනීම | 2700.00 |
| 83 | මහින්ද සයිකල් ස්ටෝර්ස්<br>වීරකැටිය පාර, මිද්දෙනිය | කටුවන ප්‍රාදේශීය සභාව සතු 53-1634 අංක දරණ කැබ් රථයට බැටරියක් ලබා ගැනීම | 20400.00 |
| 84 | මහින්ද සයිකල් ස්ටෝර්ස්<br>වීරකැටිය පාර, මිද්දෙනිය | කිරම ආයුර්වේදයට අහල් 10 සීලර් යන්ත්‍රයක් ගැනීම | 3250.00 |
| 85 | ඒ.ඒ.එන්. කුමාරතිලක මයා<br>ගල්පොත්තයාය, පුලම්පිටිය | කටුවන ප්‍රාදේශීය සභාවේ 2018.06.26 වන දින පවත්වන්නට යෙදුණු ඩෙංගු හා නගර පවිත්‍ර වැඩසටහනේ මිද්දෙනිය නගරයේ කාණු සුද්ද කිරීම වෙනුවෙන් JCB යන්ත්‍රයට කුලී ගෙවීම<br>මුළු මුදල = රු.13200.00<br>සභාව විසින් ඉන්ධන සැපයීම වෙනුවෙන් = රු. 5995.00<br>ගෙවීමට ඇති මුදල = රු. 7205.00 | 7205.00 |

**යෝජනා:-**

01). 2019 වර්ෂය සඳහා ජල ලේඛන තුලනය කිරීම සඳහා "ආකෘති 09" සඳහන් ජල ලේඛන 20ක් ලබා දීමට සුදුසු බව නිර්දේශ විය.

02). 2018.07.31 දින පැවති සුපුන් කව රැස්වීමේදී ඉදිරිපත් වූ යෝජනා,

I. කටුවන ප්‍රාදේශීය සභා මිද්දෙනිය උප කාර්යාලයේ පිහිටි ජල ගබඩාව සහා ලිපි ද්‍රව්‍ය ගබඩාව එකම ස්ථානයක ස්ථාපිත කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර මහා සභාවට ඉදිරිපත් කිරීමට සුදුසු බව නිර්දේශ විය.

II. මිද්දෙනිය කාර්යාලයේ නිලධාරීන්ගේ වාහන නතර කිරීම සඳහා ස්ථානයක් සකස් කිරීමට සුදුසු බව නිර්දේශ විය.

III.කිරම උප කාර්යාලයට සංග්‍රහ කටයුතු සිදු කිරීමට අවශ්‍ය පීරිසි, ජෝගු,ට්‍රේ ලබා දීමට සුදුසු බව නිර්දේශ විය.

IV.කාර්යාලීය ප්‍රයෝජනය සඳහා අවශ්‍ය කරන ප්‍රින්ටර් 02 ක් (කලර් ප්‍රින්ටර් 01 ක්, ඩොට්මෙට්‍රික්ස් ප්‍රින්ටර් 01 ක් ) ලබා ගැනීමට සුදුසු බව නිර්දේශ විය.

V.කාර්යාලයේ සියළුම නිලධාරීන්ට අවශ්‍ය මැගසින් හෝල්ඩර් සහ ඒ සඳහා අවශ්‍ය කබඩ් සහ රාක්ක ලබා දීමට සුදුසු බව නිර්දේශ විය.

03.ලිපි ද්‍රව්‍ය ගබඩාව සඳහා අවශ්‍ය කරන

I. Epson LQ 2090 රිබන් 06

II. ක්ෂේත්‍ර මුදල් එකතු කිරීමේ පොත් 100

III.9" X 4"ලියුම් කවර 2500 ලබා දීමට සුදුසු බව නිර්දේශ විය.

04.මිද්දෙනිය ප්‍රධාන ජල බලාගාරයේ මෝටරය සහ පොම්පය අළුත් වැඩියා කිරීම හදිසි සහ අත්‍යාවශ්‍ය අළුත් වැඩියාවක් බැවින්, තාක්ෂණ සේවා නිලධාරී වාර්තාවක් ලබා ගෙන එම මෝටරය සහ පොම්පය අළුත් වැඩියා කරන ආයතනයක් වෙත යොමු කර ඉක්මණින් අදාල අළුත් වැඩියාව සිදු කිරීමට සුදුසු බව නිර්දේශ විය.

ගරු ප්‍රා.ස.ම. ඒ. පී. නිශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු ප්‍රා.ස.ම. එම්. සිරිසේන මැතිතුමා.</u>**

මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ අනු අංක 09 හා 10 යටතේ එකම කෙනෙකුට එකම මාසයට අතිකාල දෙකක් ලබා දී තිබෙනවා. එයට හේතුව කුමක්ද?

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

එහිදී අතිකාල ලබා දී තිබෙන්නේ මැයි හා ජුනි මාසවලට අදාළවයි. මුද්‍රණ දොෂයක් වී තිබෙනවා.

**<u>ගරු ප්‍රා.ස.ම එම්. ඩී. සුගතදාස මැතිතුමා.</u>**

අනු අංක 83 යටතේ 53 – 1634 කැබ් රථය සඳහා බැටරියක් යොදා තිබෙනවා. නමුත් මෙම කැබ් රථය ධාවනයේ යෙදෙනවාද?

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

යාන්ත්‍රික ඉංජිනේරු වාර්තා අනුව දැනට කැබ් රථය අළුත්වැඩියාව සඳහා යොමු කර තිබෙනවා. හිටපු සභාපතිතුමා ගෙනෙන ලද කැබ් රථය වෙන්දේසි කරන්න කියා තිබුණා. නමුත් අපි එම කැබ් රථය තවම පාවිච්චි කරනවා.

**<u>ගරු ප්‍රා.ස.ම. එච්. ඒ. ප්‍රදීපා නිසංසලා මැතිතුමිය.</u>**

මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ අනු අංක 67 යටතේ කවිජ විරාන් මහතාට JCB යන්ත්‍රයක් කුලියට ලබා ගැනීම සඳහා ගෙවීම් කර තිබෙනවා. එහිදී කුමන නගරයක් පිරිසිදු කළාද යන්න සඳහන් කර නැහැ.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

ඩෙංගු වැඩසටහන සඳහා මිද්දෙනිය නගරයේ කාණු පද්ධතිය පවිත්‍ර කිරීම වෙනුවෙන් මෙම JCB යන්ත්‍රය කුලී පදනම මත යොදා ගනු ලැබුවා. එම ඩෙංගු වැඩසටහන නිසා සභාවට ලොකු ප්‍රසාදයක් ලැබුණා. මෙහි ඩෙංගු රෝගීන් නොමැති තත්ත්වයට පත් කර ගන්න අපිට පුළුවන් වුණා. මේ වන විට පිටින් පැමිණි ඩෙංගු රෝගීන් කිහිපදෙනෙක් පමණයි වාර්තා වෙන්නෙ.

**<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.</u>**

මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ අනු අංක 07 හා 08 යටතේ එකම මාසයට සේවකයකුට අතිකාල දෙකක් ලබා දීමට සඳහන් කර තිබෙනවා. එයට හේතුව කුමක්ද?

එමෙන්ම අනු අංක 45 යටතේ අප සභාවේ මිද්දෙනිය උප කාර්යාලයට CCTV කැමරා සවි කර තිබෙනවා. අපි මීට පෙර මෙහි කැමරා සවි කර තිබුණා. නැවත කැමරා සවි කිරීමට හේතුව කුමක්ද? අලුතින් කැමරා කොපමණ ප්‍රමාණයක් සවි කළාද?කුමන කම්පැණියෙන්ද සවි කලේ. ලබන සභා වාරය වන විට මෙම ආයතනය හා සවි කළ දිනය පිළිබඳ දැනුවත් කරන්න. අපි මෙම කැමරා වගකීමක් ඇති ආයතනයකින් ගෙනත් සවි කළා නම් මොන ප්‍රශ්නය ආවත් ගැටළුවක් නැහැ.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

එහිදී අතිකාල ලබා දී තිබෙන්නේ මැයි හා ජුනි මාසවලට අදාළවයි. මුද්‍රණ දොෂයක් ඇති වී තිබෙනවා. අපි සභාවට පැමිනෙන විට අකුණු සැර වැදී මෙම සවි කර තිබූ කැමරා පිච්චී තිබුණා. ඒ නිසා

නැවත කැමරා පද්ධතිය අළුත්වැඩියා කළා. තිබුණු කැමරාවලට අමතරව තව කැමරා සවි කළා. කැමරා 13 ක් සවි කර තිබෙනවා. ඒ වාගේම කිරම උප කාර්යාලය තුළත් අලුතින් කැමරා සවි කළා. මෙම කැමරා වගකීමක් සහිත ආයතනයකින් අපි අවශ්‍ය ක්‍රමවේදය අනුව ලබා ගෙන තිබෙනවා. ඒ නිසා කිසිම ගැටළුවක් නැහැ. අවශ්‍ය විස්තර වවුචරය පරික්ෂා කර ලබා ගන්න පුළුවන්.

**<u>ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා.</u>**

මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ අනු අංක 76 යටතේ සභාවට අයත් විදුලි උපකරණ ලබා ගෙන තිබෙනවා. එම උපකරණ සම්බන්ධ විස්තරයක් තිබෙනවාද? සභාව තුළ මෙම උපකරණ ගෙනත් තිබෙනවාද? මෙම උපකරණ අවශ්‍ය ක්‍රමවේදයට ලබා ගෙන තිබෙනවද?

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

අපි එම විදුලි උපකරණ මිළ කැඳවීම් කර වගකීමක් සහිත ආයතනයකින් මිලදී ගෙන තිබෙනවා. එම නිසා ගැටළුවක් නැහැ. මෙම ගෙවීමට ඉදිරිපත් කර ඇති වවුචර් සම්බන්ධව කිසිඳු ගැටළුවක් නැහැ. අපිට ලබාගත යුතු විදුලි උපකරණ පිළිබඳ දෙපාර්තමේන්තුවෙන් අපිව දැනුවත් කර තිබෙනවා. ඒ අනුව අපි විදුලි උපකරණ ලබා ගත්තා. ඒ වාගේම මෙම ඉදිරිපත් කර ඇති යෝජනාත් අපි ක්‍රියාත්මක කරමු.

2018 අගොස්තු මස 09 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටු වාර්තාවේ අනු අංක 01 සිට 85 දක්වා වවුචර් සඳහා ගෙවීම් කිරීමට හා එම කමිටුව විසින් නිර්දේශ කර ඇති අංක 01 සිට 04 දක්වා යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>06 - ආ ). වෙළඳ පොළ ආදායම් වියදම් වාර්තාව - 2018 ජූලි මස</u>

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

2018 ජූලි මස සභාව සතු සියළුම වෙළඳ පොළවල් මඟින් රු. 530165.00 ආදායමක් ලබා ඇති අතර. එම මාසය තුළ ව්‍යාපෘති දීමනාව, පොළ බදු අය කරන්නන් සඳහා කොමිස් මුදල් ගෙවීම සඳහා රු. 61296.50 ක වියදමක් දරා ඇත. ඒ අනුව මෙම වෙළඳ පොළ ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ. ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා.</u>**

මෙම පොළ ආදායමෙන් 10% කොමිස් මුදලක් පිට වෙලා තියනවා. මීන් අදහස් කරන්නේ කුමක්ද? මේවා යන්නේ කාටද, සභාවෙන් පොළ බදු අය කරන්න බැරිද? මීද්දෙනිය තොග පොලේ ආදායම අඩු වෙලා තියනවා.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

අපි පොළ බදු අය කිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත ලබා ගන්නා පිරිසට ආදායමෙන් 10% කොමිස් මුදලක් ලබා දෙනවා. ප්‍රමාණවත් සේවක පිරිසක් නොමැති නිසා සභාවෙන් යොදවා බදු අය කරන්න අපහසුයි. නමුත් අපේ ආදායම් පරීක්ෂකවරු පොළ බදු අය කිරීමට අදාළව බිල් කිරීම් සිදු

කරනවා. ඒ වාගේම අධීක්ෂණය සිදු කරනවා. මුල්ඇඩියාවල පොළ නිසා මිද්දෙනිය තොග පොළට ලැබෙන නිෂ්පාදන අඩු වී තිබෙනවා.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.**

පසුගිය කාලවල පොළෙහි ආදායම අඩු වෙලා තිබෙනවා. මුල් කාලවල පොළ බදු අය කරන්නන් බිල් කිරීම් කර මුදල් ද අය කළා. නමුත් මෑත කාලයේ ආදායම් පරීක්ෂකවරුන් බදු අය කිරීමට දායක වී ඇති නිසා ආදායම වැඩි වී තිබෙනවා. ඒ වගේම අපි දැන ගන්න කැමතියි පොළ බදු අය කරන්න කී දෙනෙක් සිටිනවද? මොවුන් අඛණ්ඩව බදු අය කරනවාද? අලුතින් බඳවා ගන්න ක්‍රම වේදයක් නැද්ද? සේවා කොන්දේසිවල මොවුන්ගේ සේවා කාල සීමාව අවසන් වූ පසු නැවත බඳවා ගැනීමේ ක්‍රමවේදයක් සඳහන් කර නැද්ද?

තොග වෙළඳපොළ ආදායම අඩු වෙලා තිබෙනවා. තොග වෙළඳපොළ පැරණි පොළ භූමියට ගෙන එන්න අවශ්‍යයි කියලා මම යෝජනාවක් කළා. ඒ සම්බන්ධව සාකච්ඡාවක් පවත්වා තීරණයක් ගන්නවා කිව්වා. නමුත් එය තවම ක්‍රියාත්මක වුනේ නැහැ. වයසක අම්මලා තාත්තලා හරි අමාරුවෙන් නගරයට බස් එකෙන් ගේන බඩු ටික දැන් තිබෙන පොළට අරගෙන යන්න ලොකු වෙහෙසක් දරනවා. ඇතැම් වෙලාවට ත්‍රීවීල්වලට මුදලක් දී බඩු ටික ප්‍රවාහනය කර ගන්න වෙනවා.

මෙම තොග පෙළ පැරණි පොළ භූමියට ගන්නවට පාර්ක් එකේ අය කැමති නැහැ කිව්වා. නමුත් අපි ඒ අයගෙන් සභාවට ආදායමක් ලබා ගන්නෙ නැහැ. නගරය අයිති අපිට. අපිට අවශ්‍ය විදියට කටයුතු කළ යුතුයි. විවිධ අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් සඳහා භූමිය බදු දී ආදායමක් ලබා ගන්නවා. නමුත් ඇතැම් පිරිස් එයට ඇකමැති වෙනවා. භූමිය පිළිබඳ හිතලා තොග පොළ පැරණි පොළ භූමියට නොගැනීමට තීරණයක් ගත්තනම් අපි එයට එකඟයි.

පැරණි පොළ භූමිය තුළ තිබෙන මාළු ලෑලි සඳහා නිශ්චිත ස්ථානයක් සකස් කරමු කියලා දීර්ඝ කාලයක් තිස්සේ කතා කළා. නමුත් හැදුවේ නැහැ. අපි මාසිකව ආදායමක් ගන්නවා. ඔවුන් දිනකට ලක්ෂ තුනහමාරක පමණ ආදායමක් මාළු ලෑලිවලින් ලබා ගන්නවා. එම නිසා සෝදා දැමිය හැකි ලෙස කොන්ක්‍රීට් කර මාළු ලෑලි 10ක් උඩ ආවරණයක් සමඟ සකස් කර දෙන ලෙස යෝජනා කරනවා.

ගරු ප්‍රා.ස.ම. ඊ.බී. ඉන්දික මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්. එච්. ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා.**

මමත් මීට පෙර ඔය යෝජනාව සිදු කළා. සෝදලා දාලා එම වතුර බැහැල යන ක්‍රමවේදයකට මේ මාළු ලෑලි ටික හදලා දෙන්න.

**ගරු ප්‍රා.ස.ම. ජේ. ඒ. ගාමිණී මැතිතුමා.**

නගරය අපිරිසිදු වෙනවා කියලා තොග පොළ නගරයට ගන්නවාට වාහන පාර්ක් එකේ අය අකමැතියි. පොලේ ඉන්න වෙළෙන්දන් සියළු දෙනාම අකමැතියි. පිටුපස තියන තොග පොළ ඉදිරියට ගන්න කියා ඔවුන් කියනවා.

**ගරු ප්‍රා.ස.ම. එම්. සිරිසේන මැතිතුමා.**

මිද්දෙනිය මාළු පොලේ සිට එළවලු පොළට ජනතාවට නගින්න අපහසු නිසා පඩි පෙළ කිහිපයක් බඳින්න කියා යෝජනා කරනවා. දැනට වැලි කොට්ට කිහිපයක් තබා පඩි පෙළක් ලෙස සකස් කර ගෙන භාවිතා කරනවා.

ගරු ප්‍රා.ස.ම. එච්.ඒ. ප්‍රදීපා නිසංසලා මැතිතුමිය එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

සභාව සතු පොළවල් 08 සඳහා බදු අය කරන්න 10% කොමිස් මුදල් ලබා දීමේ පදනම මත පුද්ගලයන් 06 දෙනෙක් පමණයි බඳවා ගෙන තිබෙන්නේ. බදු අය කරන්න අපිට අළුතින් ගන්න බැහැ. එහෙම ගත්ත සමහර අය වැඩි දවසක් හිටියෙ නැහැ. ඒ නිසා මෙම බදු අය කරන අය දිගටම පොළ බදු අය කළා. මිද්දෙනිය තොග පොළ පැරණි පොළ භූමියට ගෙන එනවට පොලේ අය කැමතිත් නැහැ. එම නිසා දැනට තිබෙන ස්ථානයේම තොග පොළ ඉදිරියට ගෙන එන්න කටයුතු කරනවා. එමෙන්ම මිද්දෙනිය මාළු පොලේ සිට සිල්ලර පොළට යාම සඳහා පඩි පෙළක් තාක්ෂණික නිලධාරී හරහා ඇස්තමේන්තු සකස් කර සභා අරමුදල් යොදවා සිදු කරමු.

දැනට මාළු ලැලිවල ඉන්න ප්‍රමාණයට අපි මාළු ලැලි ටිකක් නිසි පරිදි හදලා දෙනවා. එහිදී ස්ථිර වහලවල් හදන්න බැහැ. තාවකාලික වහලක් හදලා ලැලි ටික හදමු. මෙම කටයුතු තාක්ෂණික නිලධාරී හරහා ඇස්තමේන්තු සකස් කර සභා අරමුදල් යොදවා ඉදිකිරීම් කරමු.

2018 ජූලි මස වෙළඳ පොළ ආදායම් වියදම් වාර්තාව හා මිද්දෙනිය මාළු පොලේ සිට සිල්ලර පොළට යාම සඳහා පඩි පෙළක් සකස් කිරීම මෙන්ම මිද්දෙනිය පැරණි පොළ භූමියේ දැනට සිටින අයට කොන්ක්‍රීට් යොදා මාළු ලැලි සහා අරමුදල් යොදවා සකස් කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 - ඇ ). යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව - 2018 ජූලි මස

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

සභාව සතු යන්ත්‍රෝපකරණ කුලී පදනම මත ලබා දීමෙන් හා අභ්‍යන්තර වැඩ කටයුතු සිදු කිරීම මඟින් 2018 ජූලි මස 285825.40 ක ආදායමක් ලබා ඇති අතර, මෙම යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතිය මඟින් 280286.77 ක වියදමක් රියදුරු වැටුප්, යන්ත්‍ර නඩත්තු කටයුතු මෙන්ම ඉන්ධන සඳහා වැය වී තිබෙනවා. ඒ අනුව මෙම යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ඒ. පී. නිශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම.එම්. ඩී. සුගතදාස මැතිතුමා.**

Lk 9589 ටිපර් රථය අදායමක් පෙන්නලා නැහැ. නමුත් වියදමක් තිබෙනවා. ඒ වාගේම 227-5163 ජල බවුසරය ඉන්ධන සමඟ වියදමක් තිබෙනවා. නමුත් කරන ලද වැඩක් නැහැ. රෝලර් හයර් එකට දීලා තිබුණා. නමුත් ආදායමක් පෙන්නලා නැහැ. බැකෝ යන්ත්‍රයත් එලෙසමයි. ආදායමක් නැති මුත් වියදම් කර තිබෙනවා. මෙම වාර්තා සභාවට ඉදිරිපත් කිරීමේදී ධාවන සටහන් වාර්තා සමඟ ඉදිරිපත් කරනවනම් හොඳයි. අපි ගිය සභා වාරයේදිත් එය යෝජනා කළා. අපි මන්ත්‍රීවරු 30 ක් සිටිනවා. මුදල් සම්බන්ධ අනුමත කිරීම් සිදු කරන විට ඒ පිළිබඳ සොයා බලන්න ඕන. වාහනවල ධාවන සටහන් තියනවනම් අපිට මේ වාර්තා අධ්‍යයනය පහසු වෙනවා.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

අපි රෝලර් යන්ත්‍රය පසු ගිය කාලයේ හයර් එකට දිලා තිබුණා. එහිදි දින කිහිපයකට මුදල් බැඳලා අරගෙන ගියා. ඒ මුදල ඒ මාසයේ ආදායමට ඇතුළත් වෙලා තියනවා. අපි ටිපර් රථය යවලා

රෝලර් යන්ත්‍රය නැවත ගෙන ආවා. ඒ සඳහා වැය වූ ඉන්ධන මෙහි සඳහන් කර තිබෙනවා. ජල බවුසරය මේ දවස්වල වතුර බෙදනවා. මේ වන විට පවතින නියං තත්ත්වය නිසා අපේ ජල ව්‍යාපෘතියේ වතුර අඩුයි. ඒ නිසා වතුර වදින්නෙ නැති ස්ථාන සඳහා වතුර බෙනදවා. නමුත් මෙහි ගමන් වාර ගණන පිළිබඳ සටහන් කර නැහැ. බැකෝ යන්ත්‍රය මඟින් කසල ඉඩමේ කසල ටික වළකට තල්ලු කළා. ඒ අවස්ථාවේ බැකෝ යන්ත්‍රය කැඩුණා. එම කටයුතු සඳහා වැය වූ ඉන්ධන මෙහි දක්වා තිබෙනවා. මෙම යන්ත්‍රවලට අදාළ ධාවන සටහන් අපේ මන්ත්‍රීවරුන්ට ඕනෑම අවස්ථාවක බලන්න පුළුවන්. ඒ නිසා මේ පිළිබඳ මන්ත්‍රීවරු අධ්‍යයනය කර බලන්න.

<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.</u>

රෝලර් හැටන්වල තිබිලා පටවා ගෙන ආව කිව්වා. ඒ කාල සීමාවට ආදායමක් නැද්ද? අපේ මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීමට මාර්ග අළුත්වැඩියා සිදු කර තිබෙනවද? සැබවින්ම අපේ යන්ත්‍රවලින් ආදායමක් නැද්ද? මේ වන විට මාර්ග සංවර්ධන සිදු කර තිබෙනවද? ආදළුගොඩ පාර දෙපස ශුද්ධ කර තිබෙනවා. එම ශුද්ධ කරපු විදියට වැසි කාලෙට යන්න බැහැ ලිස්සනවා. මඩ සෝදා ගෙන පාර මැදට එනවා.

<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>

අපි මාර්ග කිහිපයක් මේ වන විට සකස් කර තිබෙනවා. මෙම ආදළුගොඩ පාර දෙපස පස් කපන සමාගම් විසින් ශුද්ධ කර තිබෙනවා. අපේ මාර්ග ඉතා ඉක්මනින් අබලන් වන නිසා ඒ පිළිබඳ චීන සමාගම සමඟ කතා කරන්න අවස්ථාවක් ලබා දෙන්න කියා ලිඛිතව මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඉල්ලා සිටියා. නමුත් තවම අවස්ථාවක් ලබා දුන්නෙ නැහැ.

<u>ගරු ප්‍රා.ස.ම. එම්. සිරිසේන මැතිතුමා.</u>

පස් කපන සමාගම් නිසා බොහෝ මාර්ගවල ගැටළු මතු වෙනවා. අඹගස්ආර මාර්ගය සම්බන්ධයෙන් සම්බන්ධීකරණ කමිටුවේදි කතා කළා. එහි පස් කපන්න ප්‍රාදේශීය ලේකම් අනුමැතිය ලබා දී නැහැ. ප්‍රාදේශීය ලේකම් කිව්වේ ටිපර් රථ පස් ප්‍රවාහනය කිරීමේදී එක් මාර්ගයක ගමන් කර නැවත පැමිණීමේදී වෙනත් මාර්ගයක් භාවිතා කළ යුතු බවයි. අපි පස් කපන්න අවසර ලබා දීමේදී ගනු ලබන තැන්පත් මුදලෙන් පාරවල් හදන්න බැහැ. සභාව පස් කැපීම සඳහා අවසර ලබා දුන්නා යන මතය තිබෙනවා. යන්ත්‍රවල ආදායම් වියදම් වාර්තා ඉදිරිපත් කිරීමේදී සවිස්තරව ඉදිරිපත් කළ යුතුයි. එක් ජල බවුසරයක ගමන් වාර ගණන සඳහන් කර තිබෙනවා. අනෙක් ජල බවුසරයේ එහෙම සඳහන් කර නැහැ. ඒ නිසා විශ්ලේෂණ වාර්තා හරියට ලබා දෙන්න.

<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.</u>

මේ වන විට හයිවේ එකට පස් අදින ප්‍රමාණය වැඩි වී තිබෙනවා. අපේ මාර්ග මේ සඳහා භාවිතා කරනවා. මෙහිදී අපි අපේ මාර්ගයක් වෙනුවෙන් කොපමණ මුදලක් තැන්පත් කර ගන්නවාද? ආදළුගොඩ පාරේ පස් අදිනවා. එහි කොන්ක්‍රීට් එක බැහැලා. දැන්ම ස්ථාන පරීක්ෂණයක් කර බලන්න. තිබුණට වඩා කොන්ක්‍රීට් ගල් ගැලවිලා. පාර හානි වෙන ප්‍රමාණය වැඩියි. මෙම මාර්ග නැවත සකස් කිරීමේදී අපිට පාඩු විඳ දරා ගෙන සකස් කර ගන්න වෙනවා.

පාරවල් කැඩුණම ජනතාව අපිට බනිනවා. වැලිපිටිය මාර්ගයත් කැට ඉවත් කර ඩෝසර් කරලා. එම මාර්ගය පස් කපා අවසන් වූ පසු සකස් කරනවද? ගරු හිටපු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා සමයේ ගමේ පාරවල් හදලා යටිතල පහසුකම් දියුණු කළා. අපි එය ආරක්ෂා කර ගත යුතුයි.

**ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා.**

අපි අපේ මාර්ග පස් කපන සමාගම් සඳහා භාවිතා කිරීමට අවසර ලබා දීමේදී අදාළ මාර්ග පිළිබඳ පරීක්ෂා කර බලා ඇස්තමේන්තුවක් සකස් කර, තක්සේරු කර වටිනාකම අනුව තැන්පතුවක් ගන්න ඕන.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

පස් කපන ආදළුගොඩ මාර්ගය සඳහා අපි පැමිණීමට පෙර අවසර ලබා දී තිබෙනවා. ඇතැම් පස් කපන ස්ථාන සඳහා අපි අවසර ලබා දී නැහැ. අපේ මාර්ග විනාශ වන නිසා මාර්ග සංවර්ධන අධිකාරිය සමඟ කතා කර හයිවේ එක හදන චීන සමාගම සමඟ කතා කරන්න අවස්ථාවක් ලබා දෙන්න කිව්වා. නමුත් තවම අවස්ථාවක් ලැබී නැහැ. පස් කපන සමාගම් සඳහා අපි අපේ මාර්ග භාවිතා කිරීමේදී ගිවිසුම්ගත වී තක්සේරු කර තැන්පතු මුදලක් තබා ගන්නවා. අපි මාර්ගය භාවිතා කරන්න අවසර ලබා දෙනවා. ඔවුන් මාර්ගය සකස් කර දුන් පසු අපිට එම තැන්පතුව නිදහස් කරන්න පුළුවන්

2018 ජූලි මස යන්ත්‍රෝපකරණ ආදායම් වියදම් වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 06 - ඈ ). 2018.07.01 දින සිට 2018.07.31 දක්වා ඉන්ධන වැයවීම් පිළිබඳ වාර්තාව.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

සභාව සතු භාවිතයේ පවතින සියළුම වාහන හා යන්ත්‍රෝපකරණ සඳහා 2018 ජූලි මසට අදාළව රු . 300996.00 ඉන්ධන වියදමක් දරා ඇත. ඒ අනුව මෙම ඉන්ධන වියදම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ. ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම. එම්. සිරිසේන මැතිතුමා.**

මෝටර් ග්‍රේඩරය සඳහා ගිය මස ලොකු ඉන්ධන පිරිවැයක් දරා තිබෙනවා. මෙම යන්ත්‍රය මඟින් කුමන ප්‍රදේශවල මාර්ග සංවර්ධනය සිදු කරනු ලැබුවාද යන්න පැහැදිලි නැහැ.

**ගරු ප්‍රා.ස.ම. යූ. ජී. ධර්මසිරි මැතිතුමා.**

අපි මාර්ග බොහෝ ප්‍රමාණයක් මෝටර් ග්‍රේඩර් කර තිබෙනවා. ගමන් කිරීමට අපහසු ලොකු ගැටළු පැමිණි මාර්ග තිබුණා. ඒවා සකස් කර දී තිබෙනවා. එහිදී ආන්දායම්ගොඩ මාර්ග තුනක්, ඉත්තැකුරුගොඩ පාර ආදී මාර්ග රැසක් කැපුවා.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.**

ජනතාවගේ අවශ්‍යතාවය මත අපි මාර්ග සකස් කරන්න ඕන. අපි විමසන විට මේ මේ පාරවල් කැපුවා කියනවා. වැඩ කරන්න ඕන. නමුත් සකස් කරන ලද මාර්ග ටික දැන ගැනීම සඳහා ඉදිරිපත් කළානම් හොඳයි. අපේ මන්ත්‍රීවරුන්ගේ ඉල්ලීම් මත කපන ලද මාර්ග ටික ඉදිරිපත් කළානම් ගැටළුවක් නැහැ.

**<u>ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා.</u>**

අපේ ට්‍රැක්ටර් දෙකට එකම ප්‍රමාණයෙන් ඉන්ධන සපයා තිබෙනවා. නමුත් මිලෙහි වෙනසක් තිබෙනවා. අනුමත කිරීමේදී ගැටළුවක් එනවා.

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

අපි මේ වන විට මන්ත්‍රීතුමන්ලාගේ ඉල්ලීම් පරිදි බොහෝ මාර්ග ප්‍රමාණයක් සකස් කර තිබෙනවා. එහි ලේඛනයක් ලබා දෙන්න පුළුවන්. සභාව සතු ට්‍රැක්ටර් දෙක සඳහා එකම ප්‍රමාණයෙන් ඉන්ධන ලබා ගත්තද මිළ සූත්‍රය සමඟ මේ ඉන්ධන බිල් දෙකෙහි මිළෙහි වෙනසක් වී තිබෙනවා.

2018.07.01 දින සිට 2018.07.31 දක්වා ඉන්ධන වැයවීම් පිළිබඳ වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>06 - ඉ ). 2018 ජනවාරි මස සිට ජූනි මස දක්වා ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව.</u>

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

සභාව සතු ලොකුම ආදායම් මාර්ගය වන ජල ව්‍යාපෘතිය පිළිබඳ ප්‍රථම වතාවට ආදායම් වියදම් විශ්ලේෂණ වාර්තාවක් සභාව වෙත ඉදිරිපත් කර තිබෙනවා. මෙම වාර්තාව අනුව මේ වන විට 3660 ක ජල පාරිභෝගික සංඛ්‍යාවක් ඇති අතර, 2018 ජූනි මස වන විට රු. 1431554.00 ක ආදායමක් ලබා ඇත. එම මසට අදාළව ජල ගිණුම මඟින් 730435.65 ක වියදමක් දරා ඇත. මෙම ජල ව්‍යාපෘතිය මඟින් ජූනි මසට අදාළව 701118.35 ශුද්ධ ලාභයක් ලබා ඇත. ඒ අනුව මෙම ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්. ඩී. එම්. ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.</u>**

සභාව සතු ජල ව්‍යාපෘතිය මඟින් මීද්දෙනිය කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් 04 ක්, මුරුංගස්යාය කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් 05 ක් හා වැලිපිටිය කොට්ඨාසයේ ග්‍රාම නිලධාරී වසම් 03 ක් ඇතුළු ග්‍රාම නිලධාරී වසම් බොහෝ ප්‍රමාණයක් ආවරණය වන පරිදි විශාල ජනතාවකට සුවිශේෂී සේවයක් සිදු කරනවා. ජල ව්‍යාපෘතිය සම්බන්ධව මෙලෙස සභාවට නිශ්චිත පිළිතුරක් ලබා දීම පිළිබඳ අපි සතුටු වෙනවා. මෙවැනි වාර්තාවක් ලබා දීම පිළිබඳ ස්තුතිය ප්‍රකාශ කරනවා.

ජල පාරිභෝගික පවුල් 3660 ක් සිටිනවා. මාසෙන් මාසයට නව ජල සම්බන්ධතා අවශ්‍යතාවය අනුව ලබා දී තිබෙනවා. මෙම ජල සම්බන්ධතා ජල ධාරිතාව පදනම් කර ගෙන පැහැර නොහැරිය ඉල්ලීම් මත ලබා දීමට සිදු වෙනවා. අපි සභාව ලෙස මන්ත්‍රීවරු 30 ක් සිටිනවා. අපි 30 දෙනාගෙන් ශාන්ත මන්ත්‍රීතුමත්, ගාමිණී මන්ත්‍රීතුමත්, සනත් මන්ත්‍රීතුමත්, මමත් ජල ගැටළුවේදී ඍජුවම සම්බන්ධ වෙනවා. ජල ව්‍යාපෘතිය මඟින් කාර්යක්ෂම සේවාවක් ලබා දීම සඳහා සිටින සේවක සංඛ්‍යාවෙන් ඔබතුමාලා ප්‍රයෝජනය ලබා ගෙන තිබෙනවා. නමුත් යම් යම් අවස්ථාවල පොඩි පොඩි ගැටළු මතු වී තිබෙනවා. ඒ දේවල් අපි හදාගත යුතුයි.

ජලය ලබා දීම සභාව සතු වගකීමක් වෙනවා. පොළව යට තිබෙන වතුර ටිකට මේක මගේ, මේක අපේ කියලා කාටවත් අයිතිවාසිකම් කියන්න බැහැ. එදා සභාවේදී මෙම ජල ව්‍යාපෘතියෙන් ජලය ලබා දීමේදී හිටපු ගරු මන්ත්‍රීතුමන්ලා වන ජයන්ත මන්ත්‍රීතුමත්, මමත්, අරවින්ද මන්ත්‍රීතුමාත් ලොකු

අරගලයක් කළා. සභාපතිතුමා එය දන්නවා. අද ඒ අරගලයට සනත් මන්ත්‍රීතුමා ඇතුළු මන්ත්‍රීවරු මුහුණ දෙනවා. මිනිස්සුන්ට තීන්දු ගන්න දෙන්න බැහැ. අපේ පාරිභෝගික ජනතාව වෙනුවෙන් අපි තීරණ ගත යුතුයි.

අපි භූ විෂමතා අනුව අදාළ ස්ථානවල නළ ළිං ඉදිකර භූගත ජලය පොම්ප කර වතුර ලබා දුන්නා. ඒ ලබා දෙන ජලය භාවිතා කිරීම සම්බන්ධයෙන් ගැටළු තිබෙනවා. කූඩගොඩ ප්‍රදේශයට ජලය ලබා දීම සම්බන්ධයෙන් ඒ කාලයේ සිටම ලොකු වෙහෙස මහන්සියක් දැරුවා. ඒ කාලේ කූඩගොඩ ප්‍රදේශයට වතුර ලබාදුන්නේ තෝරකොළයාය, මිද්දෙනිය ආදී ප්‍රදේශවලින් අපි ලබා ගන්නා ලද ජලයයි. ජල ව්‍යාපෘතිය ආරම්භ කළ කාලේ ඉඳලා කූඩගොඩ මිනිස්සුන්ගේ ගැටළුවක් තියන.වා මේ දෙවල් තමන්ගේ නිසා අන් අය ඉන් ප්‍රතිලාභ ලබනවට කැමති නැහැ.

කූඩගොඩ මිනිසුන්ගේ ක්‍රියා කලාපය පිළිබඳ ඒ කාලයේ මැතියස් පැටිමහත්තයා හොඳට කියනවා. දැන් ඒ පිළිබඳ දැන ගන්න ඔහු නැහැ. කූඩගොඩ හා දඹේතලාව යන දෙකෙහිම ප්‍රතිපාදන මත කූඩගොඩ නළ ළිඳ හා පොම්පාගාරය ඉදි කළා. අද ඒ අය මේ ව්‍යාපෘතියෙන් පිටට ජලය දෙන්න බැහැ කියනවා. ඒක එයාලගෙ කියලා අයිතිවාසිකම් කියන්න ඒගොල්ලන්ට බැහැ.

මීට පෙර මිද්දෙනිය හා තෝරකොළයාය ප්‍රදේශවලින් ලබා ගත් ජලය ඔවුන්ට ලබා දුන්නා. එදා සම්බන්ධීකරණ කමිටුවේදී ඔබතුමා ප්‍රකාශ කළා පැයක් දෙකක් වතුර ගහන විට ලීටර්10000 ටැංකි දෙක පිරෙනවා කියලා. ඒ වාගේම පැය 24 පුරාම වතුර ගහන්න පුළුවන් ජල ධාරිතාවක් පවතින බව ජල සම්පාදන මණ්ඩලය සහතික කරලා තියනවා කියලා . එම නිසා මෙම කූඩගොඩ ජල ව්‍යාපෘතියෙන් අඹවත්තට බටලයින් එකක් යොදා වතුර ලබා ගන්නා ලෙස මම අද යෝජනා කරනවා. එවිට වතුර නොවදින හැම නිවසකටම වතුර ලබා දෙන්න පුළුවන්.

මිනිස්සුන්ට වතුර නොලැබුණොත් මන්ත්‍රීවරුන්ට ගැටළු එනවා. ඒවා අපි සභාපතිතුමාට යොමු කර පාලනය අපේ නොවේ කියලා ඉන්න පුළුවන්. නමුත් අපි එවැනි පටු වාසි ලබා ගන්න යන්නෙ නැහැ. මොන තීන්දු තීරණ ගත්තත් මිනිස්සුන්ට පාලනය කරන්න දෙන්න හොඳ නැහැ. එහෙම වුණොත් මිනිස්සු ඉදිරියේ සභාව හැල්ලුවට ලක් වෙනවා. අපිට ස්වාභාවිකව පවතින දෑ සඳහා අයිතිවාසිකම් කියන්න බැහැ. මිනිස්සුන්ට පොළව හා ඊට උඩින් මෙන්ම පොළව යටින් අයිති වන ප්‍රමාණයක් තිබෙනවා. ඉන් එහාට අපිට අයිතිවාසිකම් කියන්න බැහැ. එය අයත් වන්නේ රජයටයි. මීට පෙර ඒ අය අඹවගාවෙන් ලබා දුන් ජලය භාවිතා කළ බව මතක් කර දෙන්න.

සභාපතිතුමනි, ජනතාවගේ දානයට, මඟුලට ආදී අවස්ථාවන් සඳහා බවුසර් මඟින් ජලය ලබා දෙනවා. මේ නියං සමයේ වුවද හදිසි අවස්ථාවලදී මුදලට වතුර ඉල්ලුවිට ඒ ඉල්ලීමත් සපුරා දෙන්න කියා යෝජනා කරනවා. ඒ වාගේම එවැනි අවස්ථාවල බවුසර්වලට වතුර සැපයීම සඳහා බවුසර් පොයින්ට් එකක් වැලිපිටියෙ හරි ඉදි කරන්න කියා ඉල්ලා සිටිනවා. කැකිරිඔබඩ ජල යෝජනා ක්‍රමය නතර කරලා නේද තියෙන්නේ. තාවකාලික පැලැස්තර පමණයි ජල යෝජනා ක්‍රමයේ තියෙන්නේ.

මුරුතවෙල ජල යොජනා ක්‍රමය මිද්දෙනිය නගරයට ආසන්ව පැමිණ තිබෙනවා. දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට යොමු කර මුරුතවෙල ජල යෝජනා ක්‍රමය ලබා ගන්න කටයුතු කරන්න. එමෙන්ම අපේ වතුර නිසා මිනිස්සුන්ට වැසිකිළියක්, බාත්රූම් එකක් පාවිච්චි කරන්න අමාරුයි. කිවුල

මිදිලා විනාශ වෙනවා. මීද්දෙනිය ප්‍රදේශයට පමණයි පිරිසිදු වතුර ටිකක් නැත්තේ. මෙම ජල ගැටළුවට විසඳුමක් සෙවීම සඳහා එම ජල යෝජනා ක්‍රමය ලබා ගැනීමට කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති අයි . ජී. මහින්ද මැතිතුමා.</u>**

අපි කූඩගොඩ ජල යෝජනා ක්‍රමයෙන් අඹවගාවට බටලයින් එකක් යොදා වතුර ගන්න වෙනවා. සෑම නිවසකටම නැත්නම් වතුර වදින්නෙ නැහැ. නමුත් කූඩගොඩ ජනතාව ඒකට කැමති නැහැ. ඒ නිසා මේ පිළිබඳ කතා කර බලන්න වෙනවා. කොලොන්න, කැල්ල ජල යෝජනා ක්‍රමය මේ වන විට වළල්ගොඩ දක්වා ඇවිත් තිබෙනවා. ප්‍රතිපාදන වෙන් කර ගැනීම සඳහා ව්‍යාපෘති යෝජනාවක් සකස් කර ලබා දෙන ලෙස ගරු ආනන්ද කුලරත්න මැතිතුමා පවසා සිටියා. ඒ අනුව අපිට එම ජල යෝජනා ක්‍රමය ලබා ගන්න පුළුවන් වෙයි.

අපි වතුර නැහැ කියලා වතුර බවුසර් දානයට, මළ ගෙවල් සඳහා මඟුල් ගෙවල් සඳහා ලබා දීම නවත්වා නැහැ. ඒ සඳහා අපි ජල බවුසර ලබා දෙනවා. කූඩගොඩ අපි බවුසර් පොයින්ට් එකක් හදලා තියනවා. ඒකෙන් වතුර බවුසර් ලබා දෙන්න පුළුවන්. ව්‍යාපාරික අවස්ථාවලදී මුදලටත් වතුර ලබා දෙනවා. නමුත් එවැනි අවස්ථා හරිම අඩුයි. අපි කෙසේ හෝ ජනතාවට වතුර ලබා දෙන්න කටයුතු සිදු කර තිබෙනවා. කැකිරිඕබඩ ජල යෝජනා ක්‍රමයේ වැඩ ආරම්භ කරනවා.

**<u>ගරු ප්‍රා.ස.ම. ජේ. ගාමිණී මැතිතුමා.</u>**

පනාමුර ජල යෝජනා ක්‍රමය මීද්දෙනිය නගරය දක්වා ගෙන ඒම සඳහා සම්බන්ධීකරණ කමිටුවට යොමු කර අවශ්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධ යෝජනාව මම ස්ථිර කරනවා.

**<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්. එච්. ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා.</u>**

කූඩගොඩ ජල ව්‍යාපෘතියේ වතුර අඹ වගාවට අරගෙන බෙදා හරිනවට දඹේතලාවෙ ජනතාව කැමති නැහැ. එහෙම කරනවනම් අපි ගමේ ජනතාව සමඟ කතා කර අදහස් ලබා ගන්න අවශ්‍යයි. සියළුම මන්ත්‍රීවරුත් සම්බන්ධ වෙලා ගරු මහින්ද අමරවීර මැතිතුමා හෝ එතුමාගේ කවුරු හෝ සම්බන්ධ කර ගෙන මේ වැඬේ ක්‍රියාත්මක කරමු.

ගමක් තරහ කර ගෙන වැඩ කරන්න බැහැ. බටලයින් කඩලා දැම්මොත් වැඩක් නැහැ. ජල ව්‍යාපෘතියේ ආරක්ෂාවත් අපි තහවුරු කරන්න ඕන. ඒ නිසා ගමේ අය සමඟ සාකච්ඡා කර ගැටළුව විසඳ ගමු. මම දවසක් අරගෙන ගමේ අය සම්න්ධ කර රැස්වීමක් ගන්නම්. පෙර හිටිය සභාපතිතුමාත් මේ ගැටළුව නිසා ප්‍රශ්න රැසකට මුහුණ දුන්නා. එහෙම වුණොත් මටත් මන්ත්‍රීකම දාලා යන්න වෙයි.

**<u>ගරු සභාපති අයි . ජී. මහින්ද මැතිතුමා.</u>**

කූඩගොඩ ජල ව්‍යාපෘතියෙන් අඹ වගාවට බට ලයින් එකක් යොදන්න වෙනවා. නැත්නම් දඹේතලාව වැනි ප්‍රදේශවලට වතුර වදින්නෙ නැහැ. අඹවගාවෙන් වතුර ලබා දෙන විට ඒ ප්‍රදේශවලට වතුර වදිනවා. කූඩගොඩ ටැංකිවලට පැයක් වතුර ගහන විට පිරෙනවා. ඉතිරි වෙලාවේ අඹ වගාවට වතුර ගැහැව්වනම් ජල ප්‍රශ්නය විසඳ ගන්න පුළුවන්. ඒ නිසා ඒ පිළිබඳ ගමේ අය සමඟ සාකච්ඡා කර අවශ්‍ය කටයුතු සිදු කරමු. ගමේ අය කිහිප දෙනෙක් මේ ප්‍රශ්නය හසුරුවනවා. ඒ නිසා ගමේ අය ගැටළු ඇති කරනවා. අපි මේ ජලය අඹ වගාවට ගැනීම පිළිබඳ රැස්වීමෙදි පැවසූ අවස්ථාවේ ගමේ අය විරෝධතාවය ප්‍රකාශ කළා.

**<u>ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා.</u>**

එහි ජල ධාරිතාව වැඩිපුර තිබෙනව නම් අපි ගමේ අයට අවබෝධ කර දී අවශ්‍ය කටයුතු සිදු කරමු.

**<u>ගරු ප්‍රා.ස.ම. එම්. සිරිසේන මැතිතුමා.</u>**

මෙම ජල ව්‍යාපෘති වාර්තාව අනුව අදාළ මස බිල්පත් ලැබීම් ඇතැම් මාසවල අඩු වෙලා. ඇතැම් මාසවල වැඩි වී තිබෙනවා. වැටුප් හා වේතන මැයි මස ලක්ෂ එකහමාරක් පමණ වැඩි වී තිබෙනවා.

**<u>ගරු සභාපති අයි . ජී. මහින්ද මැතිතුමා.</u>**

ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාවේ මාසයට එන බිල් කිරීම්වලින් බොහෝමයක් අය වෙනු ලබන්නේ ඊළඟ මාසයේ. ඒකයි අදාළ මස බිල් කිරීම්වල අය වීම අඩු ප්‍රතිශතයක් පෙන්වනු ලබන්නේ. ජල අංශයේ රාජකාරී කරන සේවකයින් වෙනත් අංශවල සේවය සඳහා යොදා තිබුණා. නමුත් ජල අංශයට සේවකයින් ප්‍රමාණවත් නොමැති නිසා නැවත ඔවුන් ජල අංශයේ සේවය සඳහා යොදවා තිබෙනවා. එමෙන්ම මෙම ජල ගිණුමෙන් ආදේශක වැටුප් ගෙවනවා. ඒ නිසා වැටුප් හා වේතන වැඩි වී තිබෙනවා.

2018 ජනවාරි මස සිට ජූනි මස දක්වා ජල ව්‍යාපෘති විශ්ලේෂණ වාර්තාව සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>07. බැංකු සැසඳුම් වාර්තාව හා ප්‍රාස. 14 , 16 – 2018 ජූලි මස</u>

**<u>ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.</u>**

සභාව මඟින් පවත්වා ගෙන යන පහත සඳහන් බැංකු ගිණුම්වල ශේෂයන් හා ප්‍රා.ස.16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය, ප්‍රා.ස. 14 ඒකාබද්ධ වැය සාරාංශය සභා සම්මත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

01. 265 – 1 – 001 – 9 – 7876587 - පොදු අරමුදල් ගිණුම.

02. 265 – 1 – 001 – 2 - 7876595 - පොළ ව්‍යාපෘති ගිණුම

03.. 265 – 1 – 001 – 7 – 7876593 - ජල ව්‍යාපෘති ගිණුම

04. 0072633606 - කර්මාන්ත ගිණුම.

05. 265 – 1 – 001 – 3 – 0020439 - සේවක ණය ගිණුම.

06. 0077187171 - මෙහෙයුම් හා නඩත්තු ගිණුම

- ප්‍රා. ස.16 – 2018 මැයි මස ඒකාබද්ධ ලැබීම් සාරාංශය.
- ප්‍රා.ස.14 - 2018 මැයි මස ඒකාබද්ධ ගෙවීම් සාරාංශය.

ගරු ප්‍රා.ස.ම. පී. කොඩිතුවක්කු මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

2018 ජූලි මස ගෙවීම් හා බැංකු සැසඳුම් වාර්තාව හා ප්‍රා.ස. 14, 16 සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08 - වෙනත් යෝජනා

## 08 – 1. මිද්දෙනිය බස් නැවතුම්පොළ උඩු මහළ අංක 07 කඩ කාමරය පවරා දීම.

**ගරු සභාපති අයි . ජී. මහින්ද මැතිතුමා.**

මිද්දෙනිය බස් නැවතුම්පොළ උඩු මහළ අංක 07 කඩ කාමරය මේ වන විට එස්.පී.ජේ. ඉන්ද්‍රජිත් යන අයට අයත්ව ඇත. නමුත් ඔහුට ඇති අපහසුතා නිසා මෙම කඩ කාමරය පවත්වා ගෙන යාමට නොහැකි හෙයින් එම කඩ කාමරය ජේ. එල් ජයසිංහ යන අයට පවරා දෙන ලෙස 2018.08.08 දිනැති ලිපිය මඟින් ඉල්ලීමක් සිදු කර ඇත. තවද මෙම කඩ කාමරය ජේ. එල්. ජයසිංහ යන අය පවරා ගැනීමට 2018.08.08 දිනැති ලිපිය මඟින් කැමැත්ත ප්‍රකාශ කර ඇත. ඒ අනුව මෙම මිද්දෙනිය බස් නැවතුම්පොළ උඩු මහළ අංක 07 කඩ කාමරය චක්‍රලේඛ අනුව ජේ. එල්. ජයසිංහ යන අය පවරා දීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. චක්‍රලේඛ අනුව අවශ්‍ය කටයුතු සිදු කරන්න.

මිද්දෙනිය බස් නැවතුම්පොළ උඩු මහළ අංක 07 කඩ කාමරය ජේ. එල්. ජයසිංහ යන අයට චක්‍රලේඛ අනුව පවරා දීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08 – 2. කිරම රෝහලේ මව් සායනයේ මව්වරුන් සඳහා පෝෂණ වැඩ සටහනක් පැවැත්වීම.

**ගරු සභාපති අයි . ජී. මහින්ද මැතිතුමා.**

කිරම හා ඒ අවට එගොඩබැද්ද, කෝන්කරහේන, රදනිආර, වීදිකන්ද, බෝවල යන කොට්ඨාස හයෙහි මව්වරුන් සඳහා කිරම රෝහලෙහි මාතෘ සායනයක් පැවැත්වේ. මවුවරුන්ගේ පෝෂණය නගා සිටුවීම සඳහා දැනුවත් කිරීමේ වැඩ සටහනක් හා පෝෂණ වැඩසටහනක් කිරම මහජන පුස්තකාලය මඟින් 2018.08.30 දින පැවැත්වීමට කටයුතු සංවිධානය කර ඇත. එහිදී සායනය සඳහා සහභාගීවන මවුවරුන් 60 දෙනෙක් වෙනුවෙන් කොළ කැඳ එකක් සහ කඩල පැකට් එකක් ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. ඒ සඳහා පහත සඳහන් ඇස්තමේන්තුව පරිදි අවශ්‍ය ද්‍රව්‍ය සපයා දීම අවශ්‍යවේ . මෙම වැඩසටහන පැවැත්වීමට හා අවශ්‍ය ද්‍රව්‍ය සපයා දීම සුදුසු යැයි යෝජනා කරමි.

**දළ වියදම් ඇස්තමේන්තුව.**

01. කොළ කැඳ ලබා දීම සඳහා - රු 1800.00
( පොල්, සහල් හා කොළ වර්ග සඳහා )
02. කඩල ලබා ගැනීම සඳහා - රු 2000.00
( 10 කි.ග්‍රෑ )

ගරු ප්‍රා.ස.ම. ඩබ්. ඩී. එම්. ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. හොඳ වැඩසටහනක්. අවශ්‍ය ද්‍රව්‍ය ලබා දෙන්න.

කිරම රෝහලේ මව් සායනයේ මව්වරුන් සඳහා පෝෂණ වැඩසටහනක් පැවැත්වීම හා ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය ලබා දීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08 – 3. කිරම උප කාර්යාල භූමියේ පොල් එලදාව සම්බන්ධව.

**ගරු සභාපති අයි . ජී. මහින්ද මැතිතුමා.**

2018 වර්ෂයේ කිරම උප කාර්යාල භූමියේ පොල් එලදාව වෙළඳගොඩ පදිංචි ජී. චමින්ද සම්පත් නැමැත්තා විසින් බදු අයිතිය ලබා ගෙන ඇත. මෙහි වාර්ෂික ටෙන්ඩර් මුදල රු. 6000.00 ක් වන අතර, මාසිකව රු. 600.00 බැගින් ගෙවීමට ගිවිසුම්ගත වී ඇත. නමුත් මේ වන විට බදු මුදල් ගෙවා නොමැති අතර,

ලිඛිතව හා වාචිකව බදු මුදල් ගෙවන ලෙස දැනුම් දී ඇත. නමුත් කිරම උප කාර්යාල භූමියේ තිබෙන පොල් ගස් කිහිපයක් අනතුරුදායක නිසා ඉවත් කර තිබෙනවා. ඒ අනුව මෙහි ආදායම අඩු වී ඇති බැවින් මෙම මාසික බදු මුදල් අය කර ගැනීම ගැටළුවක් වී තිබෙනවා. එබැවින් මෙම බදු මුදල් අය කර ගැනීම සඳහා හා එලදා බදු අඩු කර ගැනීම සඳහා පොල් එලදාව පිළිබඳ ආදායම් පරීක්ෂක වාර්තාවක් ලබන සභා වාරයට ඉදිරිපත් කර ඒ අනුව කටයුතු කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ.ටී. ශාන්ත මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්. ඩී. එම්. ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.**

දැනට කිරම උප කාර්යාල භූමියේ තිබෙන පොල් ගස් ප්‍රමාණය ආදිය සම්බන්ධ වාර්තාවක් ලබන සභා වාරයට ඉදිරිපත් කරන්න.

**ගරු සභාපති අයි . ජී. මහින්ද මැතිතුමා.**

අපි ආදායම් පරීක්ෂකවරු තුන්දෙනා යොමු කර වාර්තාවක් ලබන සභා වාරයට ලබා ගෙන ඒ අනුව තීරණයක් ගමු.

කිරම උප කාර්යාල භූමියේ පොල් එලදාව පිළිබඳ ආදායම් පරීක්ෂක තිදෙනාගෙන් වාර්තාවක් ලබා ගෙන ඒ අනුව කටයුතු කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08 – 4. සෙවිලි තහඩු හා ලී දඬු ලබා ගැනීම.

**ගරු සභාපති අයි . ජී. මහින්ද මැතිතුමා.**

කටුවන, අමුදමන, මුරුතවෙළ ගෙදර පදිංචි එච්. ඒ. සෝමසිරි මහතා දරුවන් තිදෙනෙකුගෙන් යුත් සමෘද්ධිලාභියෙකි. කුලී වැඩ කරමින් එදිනෙදා ජීවිකාව පවත්වා ගෙන යනුයේ ඉතා දුෂ්කරතා මැදය. ටකරන් සෙවිලි කරන ලද මැටි බිත්ති සහිත නිවසක දරුවන් සමඟ ජීවිකාව ගෙන යනු ලැබේ. වසර කිහිපයකට පෙර නව නිවසක් බැඳ ඇති අතර එහි වහලය සකස් කිරීම සඳහා ලී දඬු හා සෙවිලි තහඩු සපයා ගැනීම දුෂ්කර වී ඇත. එම නිසා කිරම උප කාර්යාලය අළුත්වැඩියාවේදී ඉවත් කර තිබෙන ලී දඬු හා සෙවිලි තහඩු ලබා දෙන ලෙස ඉල්ලීමක් සිදු කර ඇත. නමුත් අපගේ ගල්පොතුකන්ද පෙර පාසල, මොරගහලගොඩ පෙර පාසලෙහි වහලයන් සකස් කිරීමට හා සභාවේ ගබඩාව සකස් කිරීම

සඳහා එම ඉවත් කර තිබෙන ලී දඬු හා උළු අවශ්‍ය බැවින් ඉල්ලා ඇති ද්‍රව්‍ය ලබා දිය නොහැකි බව එච්. ඒ. සෝමසිරි මහතාට දන්වා යැවීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. යූ. ජී. ධර්මසිරි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. අපේ පෙර පාසල් ටිකේ වහල සකස් කර දෙන්න. අධ්‍යාපනය ලබන්නේ අපේ දරුවෝ.

සභාවේ ඉවත් කරන ලද ලී දඬු හා සෙවිලි එච්. ඒ. සෝමසිරි මහතාට ලබා දීමට නොහැකි බව දන්වා යැවීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08 – 5. ජල මනු කියවන්නන් සඳහා මාසික දීමනාවක් ලබා දීම.

**ගරු සභාපති අයි . ජී. මහින්ද මැතිතුමා.**

දැනට අප සභාව මඟින් පවත්වා ගෙන යන ජල ව්‍යාපෘතියේ 3500 ට අධික පාරිභෝගික සංඛ්‍යාවක් ජලය භාවිතා කරනු ලැබේ. මෙම ජල ව්‍යාපෘතිය පුළුල් ප්‍රදේශයක පැතිර පවතින බැවින් එම ප්‍රදේශවල ජල බිල්පත් බෙදීම සඳහා ජල මනුකරුවන් තිදෙනෙක් සිටින ලදි. කුඩගොඩ නැ / බ හා දඹේතලාව, මුරුංගස්යාය නැ/ බ, මීද්දෙනිය උ/ නැ/ බ, වැලිපිටිය, අඹගස්ආර, සපුගහයාය, ජල උද්‍යානය හා සමූහ ගොවිපල යන ප්‍රදේශවල මේ වන විට ජල මනු සටහන්කරුවන් දෙදෙනෙකු යොදවා ජල බිල්පත් බෙදීම අගොස්තු මස සිට ක්‍රියාත්මක කර ඇත.

මනු සටහන්කරුවන් දිනකට 15 KM – 20KM ප්‍රමාණයක් ජල බිල්පත් බෙදීම සඳහා යතුරු පැදියෙන් ගමන් කිරීම සිදු කරනු ලැබේ.බිල්පත් බෙදීම සඳහා තම පෞද්ගලික යතුරු පැදි භාවිතා කරන බැවින් ඒ සඳහා ඉන්ධන දීමනාවක් ලබා දෙන ලෙසද ඔවුන් ඉල්ලීම් කර ඇත. මොවුන් දිනකට බිල්පත් 60 – 70 ක ප්‍රමාණයක් බෙදනු ලබන අතර, අපගේ ජල මෘදුකාංගයට තොරතුරු ඇතුළත් කිරීම සඳහා සෑම මසකම 20 වන දින වන විට ජල බිල්පත් බෙදා අවසන් කළ යුතුය.

එම දින වන විට ජල බිල්පත් බෙදා අවසන් කරන මනු කියවන්නන් හට දිරි දීමනාවක් ලෙස මසකට බිල් කිරීම්වලින් 0.5% දීමනාවක් ලබා දීමටත්, ජල බිල්පත් බෙදීම සඳහා තම පෞද්ගලික යතුරු පැදියෙන් මසකට 400 KM ට වඩා එහා මෙහා යාම සඳහා රු 1000.00 ක ඉන්ධන දීමනාවක් සැප්තැම්බර් මස සිට ලබා දීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්. ඩී. එම්. ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.**

විදුලිබල මණ්ඩලයේ එක් අයෙක් කරන කාර්යය අපේ සේවකයෝ දෙන්නෙක් සිදු කරනවා. හරියට බිල් දෙනවනම් අදාළ දීමනා ලබා දීම සම්බන්ධව ගැටළුවක් නැහැ. යෝජනාව හොඳයි. මිනිසුන්ට හරියට බිල යනවනම් අපිට ආදායම ලැබීම සම්බන්ධයෙන්ද ගැටළුවක් ඇති වෙන්නෙ නැහැ.

**ගරු සභාපති අයි . ජී. මහින්ද මැතිතුමා.**

බිල් ටික සෑම මසකම 20 වන දිනට බෙදා අවසන් කරන්නේ නම් පමණක් අදාළ දිරි දීමනාව ලබා දෙනවා. ඉන්ධන දීමනාව තම පෞද්ගලික යතුරු පැදිය භාවිතා කරන නිසා ලබා දෙනවා.

ජල අංශයේ බිල් බෙදීම් කටයුතු කරන සේවකයින් දෙදෙනාට 400 KM ට වඩා පෞද්ගලික යතුරු පැදියෙන් බිල් බෙදීම වෙනුවෙන් මසකට රු. 1000.00 ක ඉන්ධන දීමනාවක් ලබා දීමට හා 20

වන දිනට බිල්පත් බෙදා අවසන් කළහොත් පමණක් පසුගිය මසට අදාළ බිල් කිරීම්වලින් 0.5% ක දිරි දීමනාවක් ලබා දීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 08 – 6. 2019 වර්ෂය සඳහා දිනපොත් ලබා ගැනීම.

**ගරු සභාපති අයි . ජී. මහින්ද මැතිතුමා.**

අප සභාවේ ගරු මහජන නියෝජිතයින් සියළු දෙනාට හා ලේකම් මහතාට විධායක ශ්‍රේණියේ දිනපොත් හා කුඩා ප්‍රමාණයේ දිනපොත් 2019 වර්ෂයට ලබා ගත යුතුවේ. ඒ අනුව මෙම දිනපොත් මිළ කැඳවීම් කර ලබා ගැනීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. පී. කොඩිතුවක්කු මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්. ඩී. එම්. ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.**

මෙම දිනපොත් සකස් කිරීමේදී දකුණු පළාතේ මෙන්ම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු අනෙකුත් වැදගත් තොරතුරු ඇතුළත් කර දිනපොත් සකස් කරන්න. මෙවර පළාත් සභාවේ ලබා දී ඇති දිනපොත ගොඩක් වටිනවා.

**ගරු සභාපති අයි . ජී. මහින්ද මැතිතුමා.**

අපි පළාතේ මෙන්ම රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු ඇතුළු අනෙකුත් වැදගත් තොරතුරු ඇතුළත් කර අදාළ දින පොත් මිල කැඳවීම් කර සකස් කර දෙන්නම්.

ගරු මහජන නියෝජිතයින් සියළු දෙනාට හා ලේකම් මහතාට විධායක ශ්‍රේණියේ දිනපොත් හා කුඩා ප්‍රමාණයේ දිනපොත් 2019 වර්ෂයට මිළ කැඳවීම් කර ලබා ගැනීම් සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## 08 – 7. සේවක අභිප්‍රේරණ වැඩසටහනක් පැවැත්වීම.

**ගරු සභාපති අයි . ජී. මහින්ද මැතිතුමා.**

අප සභාවේ සේවයේ නියුතු කණිෂ්ඨ කාර්යය මණ්ඩලය යටතේ සේවය කරන සෞඛ්‍ය හා මාර්ග කම්කරුවන් සභාවේ ප්‍රධාන පරමාර්ථය වන කැළි කසල හා මංමාවත් ශුද්ධ පවිත්‍ර කිරීම් වෙනුවෙන් තම සේවය යොදවමින් විශාල කැප කිරීමක් සිදු කරනවා. එබැවින් ඔවුන්ගේ මානසික තෘප්තිය හා අභිප්‍රේරණය සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාගේ පූර්ව අනුමැතිය ඇතිව විනෝද චාරිකාවක් රැගෙනයාම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. යූ.ජී. ධර්මසිරි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. අනිවාර්යෙන්ම එක්ක යන්න.

**ගරු ප්‍රා.ස.ම. එම්. සිරිසේන මැතිතුමා.**

විනෝද චාරිකාව වගේම ඔවුන්ට අවශ්‍ය අඩුපාඩු හා උපකරණ ලබා දෙන්න.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්. ඩී. එම්. ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.**

ඒ මිනිස්සු උදේ ඇවිත් වැඩ කරලා හවස යනවා. ඒ අය වෙනුවෙන් මෙම වැඩසටහන සිදු කරන්න. ඒවා හරි වැදගත්. ඔවුන්ගේ මානසික මට්ටම හදන්න පුළුවන්. එවිට ඔවුන්ට සභාව ඔවුන් සමඟ සිටින බව දැනෙනවා.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

අපි අපේ කම්කරුවන් සඳහා අවශ්‍ය උපකරණ, සබන් ආදී ද්‍රව්‍ය සියල්ල සපයා තිබෙනවා. සභාව වෙනුවෙන් ඔවුන් ලොකු කාර්යය භාර්යයක් ඉටු කරනවා. ඒ නිසා ඔවුන්ගේ මානසික තෘප්තිය ඇති කිරීම සඳහා මෙම වැඩසටහන ක්‍රියාත්මක කරමු.

සේවක අභිප්‍රේරණය සඳහා සභාවේ කම්කරු පිරිස විනෝද චාරිකාවක් රැගෙන යාමට හා ඒ සඳහා ප්‍රධාන අමාත්‍යතුමාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08 – 8. ලිපි ද්‍රව්‍ය ගබඩාවට අවශ්‍ය ද්‍රව්‍ය ලබා ගැනීම.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

ලිපිද්‍රව්‍ය ගබඩාවේ පහත සඳහන් ද්‍රව්‍ය අවසන් වී ඇති බැවින් එම ද්‍රව්‍ය මිළ කැඳවීම් කර ලබා ගැනීම සුදුසු යැයි යෝජනා කරමි.

- HP LESAR 1102 TONER ( 85 A ටෝනර් ) - 06
- EPSON L 110 INK ( 664 INK ) BOTTLE ( කළු පැහැති පමණක් ) - 04

ගරු ප්‍රා.ස.ම.යූ.ජී. ධර්මසිරි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. ඒවා අරගෙන දෙන්න.

ලිපිද්‍රව්‍ය ගබඩාවට අවශ්‍ය ද්‍රව්‍ය මිල කැඳවීම් කර ලබා ගැනීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08 – 9. උලහිටියාව නැගෙනහිර පොදු සුසානභූමිය මැන නිරවුල් කර ගැනීම.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

උලහිටියාව නැගෙනහිර වසමේ පොදු සුසානභූමියක් සඳහා අක්කර දෙකක ඉඩම් කැබැල්ලක් වෙන් කර තිබුණි. නමුත් මේ වන විට අවට ඉඩම් හිමියන් විසින් මෙම සුසානභූමි ඉඩමෙන් කොටස් අල්ලා ගෙන ඇත. මෙම ග්‍රාම නිලධාරී වසම තුළ රජයට අයත් වෙනත් කිසිදු ඉඩමක්ද නොමැත. එමෙන්ම නුදුරු අනාගතයේදී ප්‍රජාවට සුසානභූමිය නැතිවම බැරි දෙයකි. එම නිසා මෙම සුසානභූමි ඉඩම මැන නිරවුල් කර සභාවට පවරා ගන්නා ලෙස ගරු ප්‍රා.ස.ම. ඩී. රාජපක්ෂ මැතිතුමිය යෝජනාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව මෙම සුසානභූමි ඉඩම මැන නිරවුල් කර සභාවට පවරා දෙන මෙන් කටුවන ප්‍රාදේශීය ලේකම්ගෙන් ඉල්ලීම් කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ඩබ්. ඒ. සංජීව මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. සුසානභූමි ඉඩම් ටික මැනලා පවරා ගමු.

උලහිටියාව නැගෙනහිර සුසානභූමි ඉඩම මැන නිරවුල් කර සභාවට පවරා දෙන මෙන් කටුවන ප්‍රාදේශීය ලේකම්ගෙන් ඉල්ලීම් කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08 – 10. උලහිටියාව නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ සෞඛ්‍ය මධ්‍යස්ථානය සඳහා උපකරණ ලබා ගැනීම.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

උලහිටියාව නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටා ඇති සෞඛ්‍ය මධ්‍යස්ථානයේ මාතෘ හා ළමා සායනයේ ග්‍රාම නිලධාරී වසම් පහක් ආවරණය වන පරිදි සායන කටයුතු පවත්වනු ලැබේ. නමුත් මේ වන විට එයට අවශ්‍ය මූලික පහසුකම් වන විදුලිය හා ජල පහසුකම් නොමැත. එමෙන්ම මේසයක්, කබඩ් එකක් හා පොත් රාක්කයක්ද අවශ්‍යවේ. ජලය හා විදුලි ලබා ගැනීම පිළිබඳ යෝජනාව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවට යොමු කර ඇත. අනෙකුත් අවශ්‍ය පහසුකම් වන මේසය, පොත් රාක්කය, කබඩ් එකක් ලබා දෙන ලෙස ගරු ප්‍රා.ස.ම. ඩී. රාජපක්ෂ මැතිතුමිය යෝජනාවක් ඉදිරිපත් කර ඇත. නමුත් අපිට මෙම උපකරණ ලබා දීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති බැවින් එම උපකරණ ලබා දෙන ලෙස පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. මානෙල් දිසානායක මැතිතුමිය එම යෝජනාව ස්ථිර කරන ලදි. එම උපකරණ ලබා දීම ගොඩක් වටිනවා.

උලහිටියාව නැගෙනහිර සෞඛ්‍ය මධ්‍යස්ථානය සඳහා අවශ්‍ය උපකරණ ලබා ගැනීමට පලාත් සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකගතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08 – 11. 252 – 6805 අංක දරණ කැබ් රථයට බැටරියක් ලබා ගැනීම.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

252 – 6805 අංක දරණ කැබ් රථයට යොදා ඇති බැටරියෙහි කාලය අවසන් වී ඇති බැවින් කැබ් රථය පණ ගැන්විය නොහැක. එබැවින් එම කැබ් රථයට නව බැටරියක් යෙදීම සුදුසු යැයි තාක්ෂණික නිලධාරී වාර්තා කර ඇත. එබැවින් නව බැටරියක් කැබ් රථයට ලබා ගැනීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. සුගත් සරඹගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. එම බැටරිය අරගෙන දෙන්න.

252 – 6805 අංක දරණ කැබ් රථයට නව බැටරියක් ලබා ගැනීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08 – 12. නිතර ජලය නොලැබෙන ප්‍රදේශ සඳහා නළ ළිං ඉදිකිරීම.

**ගරු ප්‍රා.ස.ම. ජේ. ඒ. ගාමිණී මැතිතුමා.**

මිද්දෙනිය කොට්ඨාසයේ මිද්දෙනිය නගරයේ සිට 1 ½ km පමණ දුරක් යන විට ඇති ප්‍රදේශවලට නියං සමයේදී විශාල වතුර හිඟයක් පවතී. එම නිසා නියං සමයේ සභාව මඟින් ලබා දෙන ජලයද මෙම ප්‍රදේශවලට නොලැබේ. එම කාලයට ජලය නොමැති වීම නිසා පහත සඳහන් ස්ථානවල නළ ළිං ඉදිකර දෙන මෙන් යෝජනා කරමි.

01. මිද්දෙනිය හුංගම පාරේ කෝංගොඩ ප්‍රදේශය

02. මිද්දෙනිය ජල උදාන ගම්මානයේ ගම මැද්දේ පිහිටි පන්සල අසල ප්‍රදේශය.

03. මිද්දෙනිය සමූහගොවිපළ අසල ගම්මාන මධ්‍යයේ.

04. මිද්දෙනිය ශ්‍රී මහින්ද නාහිමි මාවතේ බෝගහකොරටුව නිවස අසල.

05. මිද්දෙනිය මහින්ද නාහිමි මාවතේ පිහිටි අතුරු පාරක් වන වික්‍රම මාවතේ අඹගස්ආර ලොකු මහතාගේ නිවස අසල.

ගරු ප්‍රා.ස.ම. ජේ.ටී. ශාන්ත මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අපි මෙම වතුර නොමැති ප්‍රදේශවලට වතුර බවුසර් මඟින් බෙදනවා. නළ ළිං බහුතරයක් ඉදි කළ විට අපේ ළිංවල භූගත ජලය අඩු වෙයි. එම නිසා මෙම නළ ළිං ඉදිකිරීම පිළිබඳ ජල සම්පදාන මණ්ඩලය ගෙන්වා භූගත ජලය පිළිබඳ පරික්ෂා කර ඇස්තමේන්තු සකස් කළ යුතු වෙනවා. එමෙන්ම නළ ළිං ඉදිකිරීම පිළිබඳ එම ප්‍රදේශවලට අදාළ අඹ වගාව, පොල් මණ්ඩලය වැනි ආයතන සමඟ සාකච්ඡා කරන්න ඕන. මේ සඳහා අපිට ප්‍රතිපාදන නැහැ. ලබන වර්ෂයට හෝ ප්‍රතිපාදන ලබා ගෙන අවශ්‍ය කටයුතු සිදු කරමු.

මිද්දෙනිය ප්‍රදේශයේ සඳහන් කරන ලද ජලය නොවදින ස්ථාන පිළිබඳ ජල සම්පාදන මණ්ඩලයෙන් භූගත ජල ධාරිතාව පිළිබඳ පරික්ෂා කර බැලීමට හා නළ ළිං ඉදි කිරීමට අවශ්‍ය ඇස්තමේන්තු සකස් කිරීම ද එම ප්‍රදේශවල අදාළ ආයතන සමඟ සාකච්ඡා කිරීම මෙන්ම නළ ළිං සකස් කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර ගැනීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08 – 13. මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 01 සිට 08 දක්වා වූ කඩ කාමර බදු දීම සඳහා සකස් කරන ලද ගිවිසුම සම්බන්ධව.</u>

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 01 සිට 08 දක්වා වූ කඩ කාමරය දීර්ඝකාලීන බදු ක්‍රමය යටතේ මහජන බැංකුව වෙත නැවත ලබා දීම සඳහා ගිය සභා වාරයේ සභා අනුමැතියක් ලබා දුන්නා. එම සභා තීරණය අනුව ආදායම් පරීක්ෂක නිලධාරීන් තිදෙනෙක්, තාක්ෂණික නිලධාරී මෙන්ම විෂයභාර නිලධාරී එක්ව විධිමත්ව සකස් කරන ලද ගිවිසුම සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබෙනවා. මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 01 සිට 08 දක්වා වූ කඩ කාමර බදු දීමේදී මෙම ගිවිසුම අනුව ගිවිසුම්ගත වි චක්‍රලේඛ අනුව අවශ්‍ය කටයුතු සිදු කළ යුතු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. නව ගිවිසුම අනුව කඩ කාමර මහජන බැංකුවට බදු දීම සිදු කරන්න.

මිද්දෙනිය සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 01 සිට 08 දක්වා වූ කඩ කාමර මහජන බැංකුවට බදු දීමේදී නව ගිවිසුම අනුව ගිවිසුම්ගත වි චක්‍රලේඛ අනුව අවශ්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>08 – 14. කිරම වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා තක්සේරු කරන ලද බදු කුලිය සම්බන්ධව.</u>

<u>ගරු උප සභාපති එම්. ජයන්ත මැතිතුමා</u>

කිරම කඩ කාමර සඳහා තක්සේරු කරන ලද නව බදු කුලී අය කිරීම සඳහා සභා අනුමැතියක් ලබා ගත්තා. නමුත් එම බදු මුදල් වැඩි කිරීම පිළිබඳ කිරම කඩ කාමර හිමියන් 2018.08.01දින සාකච්ඡා කර එහි වාර්තාව මා වෙත එවා තිබෙනවා. මෙම කඩ කාමර සඳහා මේ වන විට කඩ හිමියන් රු.3500.00 ක මාසික බදු මුදලක් ගෙවා ඇත. තක්සේරු කළ පසු බදු මුදල් වැඩි වී ඇත. නමුත් සභාවේ නිලධාරීන් පවසා ඇත්තේ තක්සේරු කළ පසු බදු මුදල මීට වඩා අඩු විය හැකි බවයි.

කිරම නගරයක් නොවන අතර, නගරයක් ආසන්නයේවත් නැත. තවම ගමක් වන කිරම මංසන්ධියක පිහිටි කඩමංඩියකි. මෙම කඩ හිමියන් කලින් ගෙවන ලද මුදලට වඩා අඩු තක්සේරු මුදලක් බලාපොරොත්තු වී ඇත. නමුත් මේ වන විට තක්සේරු මුදල වැඩි වී තිබේ. මොවුන් තම පෞද්ගලික මුදලින් කඩ කාමර සඳහා විදුලිය ලබා ගෙන ඇත. අප විසින් ඔවුන් වෙත මේ වන විට ප්‍රමාණවත් පහසුකම් සපයා නොමැති බව පවසයි. එබැවින් මෙම කඩ කාමර නැවත තක්සේරු කර බදු මුදල අඩු කර දෙන ලෙස කඩ හිමියන් ඉලීලීමක් සිදු කර ඇත. ඒ අනුව මොවුන්ගේ ඉල්ලීම පිළිබඳ සලකා බලා මෙම කිරම වෙළඳ සංකීර්ණයේ  කඩ කාමර නැවත තක්සේරු කළ යුතු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ.ටී.ශාන්ත මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

<u>ගරු ප්‍රා.ස.ම. එම්. ඩී. සුගතදාස මැතිතුමා.</u>

අනෙක් කඩ හිමියන්ගෙන් ද එවැනි ඉල්ලීම් තිබේ නම්  මේ ඉල්ලීම සමඟම නැවත තක්සේරුවට යවන්න.

<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>

අපි බදු මුදල් වැඩි කඩ කාමර නැවත තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවට යවා තිබෙනවා. අපි දැනට අය කළ තාවකාලික තක්සේරු මුදල පදනම් කර ගෙන තක්සේරු දෙපාර්තමේන්තුව මෙම කඩ කාමර තක්සේරු කර තිබෙනවා. කිරම කඩ හිමියන් තක්සේරු දෙපාර්තමේන්තුවට ගිහින් කතා කර තිබෙනවා. එවිට සභාවේ යෝජනාවක් ලෙස එවන්න කියා තිබෙනවා. කඩ කාමර කිහිපයක හැර තක්සේරු මුදලේ ලොකු වැඩිවීමක් නැහැ. ඇතැම් කඩ කාමරවලින් තිබුණු මුදලට වඩා බදු මුදල අඩු වී තිබෙනවා. එම නිසා කඩ කාමර අංක 1, 2, 3, හා 10 පමණක් නැවත තක්සසේරු කර තක්සේරු මුදල අඩු කර දෙන මෙන් ඉල්ලීමක් සිදු කරමු.

කිරම වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 1, 2, 3, හා 10  සඳහා ලබා දී ඇති තක්සේරු මුදල වැඩි නිසා එම කඩ කාමර නැවත තක්සේරු කරන ලෙස  තක්සේරු දෙපාර්තමේන්තුවට දන්වා යැවීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08 – 15. මිද්දෙනිය නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්. ඩී. එම්. ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.**

අප සභා බල ප්‍රදේශයට අයත් ප්‍රධාන නගර වන කටුවන, කිරම, වරාපිටිය, කරමැටිය යන ස්ථානවල ජනතාවගේ මූලික අවශ්‍යතාවයන් සඳහා ප්‍රමාණවත් පහසුකම් නොමැත. මෙයින්ද මිද්දෙනිය නගරය ප්‍රධාන වේ. සති පොළ මෙන්ම රාජ්‍ය ආයතන බොහෝ ප්‍රමාණයක් තිබෙන මිද්දෙනිය නගරය වාණිජ නගරයක් වේ. මේ නිසා ජනතා අවශ්‍යතා බොහෝමයක් ඉටු කර ගැනීම සඳහා ජනතාව නගරය කරා පැමිණේ. එම නිසා නගරයේ පොදු පහසුකම්ද දියුණු විය යුතුය. නමුත් විධිමත් නගර සංවර්ධන සැලැස්මක් නොමැතිකම නිසා අනවසර ඉදිකිරීම් වැඩි වී ඇත. අපිට උත්සවයක්, රැස්වීමක් පවත්වන්න ඉඩක් නැහැ. එබැවින් රාජ්‍ය ආයතන සම්බන්ධ කර ගෙන සමීක්ෂණයක් සිදු කරමු. ඒ අනුව සියළුම ආයතනවල හා නාගරික සංවර්ධන අධිකාරියේ සහභාගිත්වයෙන් විධිමත් නගර සංවර්ධන සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. යූ.ජී. ධර්මසිරි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. කටුවන, කිරම නගර දෙකටත් නගර සංවර්ධන සැලැස්මක් සකස් කරන්න .

**ගරු ප්‍රා.ස.ම. එම්. ඩී. සුගතදාස මැතිතුමා.**

අනවසර ඉදිකිරීම් හැම තැනකම තියනවා. ඒ පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන්න.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.**

අනවසර ඉදිකිරීම් නගරයේ පමණක් නොව ගම්මාන ඇතුළෙත් තියනවා. සභාව සතු පාරවල් තවත් පුළුල් වෙන්නෙ නැහැ. නමුත් තාප්ප බැඳ තිබෙනවා. මේවා සභාවෙන් අවසර අරගෙන සිදු කරනවද? ඒ නිසා මේ පිළිබඳ සොයා බලන්න.

**ගරු ප්‍රා.ස.ම. යූ.ජී. ධර්මසිරි මැතිතුමා**

අපේ මන්ත්‍රීවරු එවැනි අනවසර ඉදිකිරීම් තිබෙන ස්ථාන දන්නවනම් සභාව දැනුවත් කරන්න. ගමේ ඉන්නේ අපි. අපි ඒ පිළිබඳ දන්නවා. ඒ නිසා ගම් සභා කාලයේ එවැනි දැනුවත් කිරීම් මන්ත්‍රීවරු විසින් සිදු කළා.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපි නගර සංවර්ධන සැලැස්මක් සකස් කිරීම පිළිබඳ යෝජනාව ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට යොමු කර අවශ්‍ය කටයුතු සිදු කරමු. අපි දැනුවත්ව ඇති අනවසර ඉදිකිරීම් පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කර තිබෙනවා. හොරේවෙලත් එවැනි ඉදිකිරීමක් සිදු වුණා. ඒ පිළිබඳ අපි නිලධාරියෙක් යවා සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කළා. අපි දැනුවත්ව නැති අනවසර ඉදිකිරීම් ඇති. එවැනි දෑ තිබේ නම් අපිව දැනුවත් කරන්න. එවිට අපි සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරනවා.

මිද්දෙනිය නගර සංවර්ධන සැලැස්ම සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම සම්බන්ධ යෝජනාව ප්‍රාදේශීය සංවර්ධන කමිටුවට යොමු කර අවශ්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## **08 – 16.** අත්‍යාවශ්‍ය ස්ථානවල වීථි ලාම්පු සවි කිරීම.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.**

අප ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ වීථි ලාම්පු විශාල ප්‍රමාණයක් සවි කර ඇතත් නිසි නඩත්තුවක් නොමැති නිසා ඉන් බොහෝ ප්‍රමාණයක් අක්‍රිය තත්ත්වයේ පවතී. ඇතැම් වීථි ලාම්පුවලට බල්බ නොමැත. ඒවා යථා තත්ත්වයට පත් කිරීම සඳහා ලොකු පිරිවැයක් අවශ්‍ය නොවේ. එමෙන්ම දේශපාලන අධිකාරියේ අනුමැතිය ඇතිව ඇතැම් ස්ථානවල සවි කර ඇති වීථි ලාම්පු මහජනතාවගේ අවශ්‍යතාවයන්ට ගැලපෙන ස්ථානවල ස්ථානගත කර නොමැති අතර, හුදෙක්ම පුද්ගලික නිවාස ඉදිරිපිට ආලෝකය සඳහා සවි කර ඇත. එම නිසා සභා බලප්‍රදේශයේ අත්‍යාවශ්‍ය ස්ථානලව වීථි ලාම්පු ස්ථානගත වී නොමැත. එම නිසා පාසල්, රජයේ ආයතන, බස්නැවතුම්පොළ, මගී ආවරණ, යන ස්ථාන සඳහා ප්‍රමුඛතාවය ලබා දෙමින් බල ප්‍රදේශයේ වීථි ලාම්පු සවි කරන ලෙස යෝජනා කරමි. එමෙන්ම නගරයේද සභාව මඟින් පාලනය වන ලෙස විථි ලාම්පු සකස් කිරීමේ ක්‍රමයක් සකස් කර ගන්නා ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ඊ. බී. ඉන්දික මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපි මේ වන විට අවශ්‍ය වීථි පහන් නඩත්තු උපකරණ ලබා ගෙන තිබෙනවා. පොදු ස්ථානවල වීථි ලාම්පු සවි කර තිබෙනවා. සවි නොකරන ලද ස්ථාන සඳහා ඉදිරියේදී වීථි ලාම්පු සවි කරනවා. අපේ මන්ත්‍රීවරු ලබා දෙන ස්ථාන සඳහාත් අපි වීථි ලාම්පු මේ වන විට සවි කරනවා.

බලප්‍රදේශයේ අත්‍යාවශ්‍ය ස්ථාන සඳහා වීථි ලාම්පු උපකරණ සවි කිරීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## **08 – 17.** සභා බලප්‍රදේශයේ සුනඛයින් වන්නත් කිරීම.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.**

අප ප්‍රාදේශීය සභා  බලප්‍රදේශයේ මේ වන විට සුනඛ ග්‍රහණය වර්ධනය වී ඇත. නමුත් මෙම සුනඛයින් විධිමත්ව වන්දීකරණය වීමක් සිදු නොවේ. මෙලෙස ව්‍යාප්ත වී ඇති සුනඛයින් අයාලේ යාම නිසා ජනතාව ආපදාවලට ලක් වීමේ අවධානම වැඩි වී ඇත. මෙම සුනඛයින්ගේ රෝම ගැලවීම, තුවාල ඇති වීම මෙන්ම වාහනවලට හසුවීම නිසා මාර්ග අනතුරුද සිදු වන ප්‍රමාණය ඉහළ ගොස් ඇත. මේ නිසා කටුවන සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය හා සම්බන්ධව වී ජංගම පසු වෛද්‍ය සේවාවක් තුළින් සුනඛයින් වන්නත් කිරීම හා ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම පී. එන්. එස්. ගුණවර්ධන මැතිතුමිය එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම. යූ.ජී. ධර්මසිරි මැතිතුමා**

ඉස්සර නම් සුනඛයින් අල්ලන්න එනවා. නමුත් දැන් එන්නෙ නැහැ. ඒ නිසා වැඩි වී තිබෙනවා.

**ගරු ප්‍රා.ස.ම. එම්. ඩී. සුගතදාස මැතිතුමා.**

ඇති කරන සුනඛයින් පමණක්ද වන්නත් කිරීම් කරන්නේ?

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

අපි ග්‍රාමීය සංවර්ධනය සඳහා ව්‍යාපෘතියක් සකස් කර තිබෙනවා. එම ව්‍යාපෘතිය සමඟ මෙම වැඩසටහන සිදු කරමු. අපි එක් කොට්ඨාසයක් වෙනුවෙන් සතියක පමණ කාලයක් වැය කර මාර්ග සංවර්ධනය, අත්‍යාවශ්‍ය ස්ථාන සඳහා වීථි ලාම්පු සවි කිරීම ආදී වූ ලොකු සංවර්ධන වැඩසටහනක් සූදානම් කර තිබෙනවා. එම වැඩසටහන සමඟ මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීමටත් සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය සමඟ සාකච්ඡා කරමු.

සුනඛයින් එන්නත් කිරීමේ වැඩසටහන බලප්‍රදේශයේ කොට්ඨාස 17 තුළ සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීම සමඟ ක්‍රියාත්මක කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08 – 18. සපුතන්ත්‍රිකන්ද සුසානභූමි ඉඩම වෙන්කර ගැනීම.

**ගරු ප්‍රා.ස.ම. ජේ.ටී. ශාන්ත මැතිතුමා.**

සපුතන්ත්‍රිකන්ද ග්‍රාම නිලධාරී වසමෙහි සුසානභූමිය සඳහා වෙන් කර ඇති ඉඩම දැනට කිහිපදෙනෙකු විසින් වගා කර ගෙන සිටිනු ලැබේ. දැනට මෙහි තිබෙන පොදු ස්ථාන නාය යන ස්ථානවල ඉදි වී ඇති බැවින් අවධානම් තත්ත්වයක පවතී. එමෙන්ම ගමේ ජනතාවගේ අවමඟුල් කටයුතු සඳහා මෙම සුසානභූමිය අත්‍යාවශ්‍ය බැවින් මැන නිරවුල් කර දෙන ලෙස ගමේ ජනතාව ඉල්ලීම් කර ඇත. ඒ අනුව මෙම සුසානභූමි ඉඩම මැන නිරවුල් කර දෙන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි. එම ඉඩම් මැන වෙන් කර ගන්න.

**ගරු ප්‍රා.ස.ම. යූ. ජී. ධර්මසිරි මැතිතුමා.**

පුවක්ගස්ආර සුසානභූමි ඉඩම මිනිස්සුන්ට දෙන්න ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ඔප්පු හදලා තිබුණා. අපි ඒ සඳහා විරුද්ධ වුණා. අපිත් මෙම සුසානභූමි මැන නිරවුල් කර සභාවට පවරා දෙන්න කියා ඉල්ලීම් කරනවා. නමුත් දෙන්නෙ නැහැ. ගම් සභා කාලයේ සිට ඉල්ලීම් කර තිබෙනවා. ඒත් වැඩක් වුණේ නැහැ.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපි කටුවන හා වලස්මුල්ල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙකෙන්ම සභාවට අයත් සුසානභූමි මැන නිරවුල් කර පවරා දෙන ලෙස ලිඛිතව කිහිප අවස්ථාවකම දන්වා යවා තිබෙනවා. නමුත් පවරා දෙන්නෙ නැහැ. අපි මුදල් බැඳ තිබෙන සුසානභූමිවත් තවම ලබා දීලා නැහැ. මෙම සුසානභූමි ඉඩමත් මැන නිරවුල් කර සභාවට පවරා දෙන ලෙස වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම්ගෙන් ඉල්ලීමක් කරමු.

සපුතන්තන්ත්‍රිකන්ද සුසානභූමි ඉඩම මැන නිරවුල් කර සභාවට පවරා දෙන ලෙස වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම්ගෙන් ඉල්ලීම් කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08 – 19. සනීපාරක්ෂක වැසිකිළි ආධාරයක් ලබා ගැනීම.

**ගරු ප්‍රා.ස.ම. අයි. කේ. සුසන්ත පද්මතිලක් මැතිතුමා.**

කිරම බිබුලේගොඩ පදිංචි කේ. එම්. අරුණ ප්‍රදීප් කුමාර මහතා ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති, අඩක් නිම කළ නිවසක ජීවත් වන අයෙකි. මේ වන විට ඔහුට සනීපාරක්ෂක වැසිකිළියක් නොමැති බැවින් සනීපාරක්ෂක වැසිකිළියක් සකස් කර ගැනීමට ආධාර මුදලක් ලබා දෙන ලෙස ඉල්ලා ඇත. එබැවින් ඔහුට සනීපාරක්ෂක වැසිකිළියක් සකස් කර ගැනීමට ආධාර මුදලක් ලබා දීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. රමනි හල්පෙ ගමගේ මැතිතුමිය එම යෝජනාව ස්තිර කරන ලදි.

**ගරු සභාපති අයි.ජී. මහින්ද මැතිතුමා.**

අපි සනීපාරක්ෂක වැසිකිළි සඳහා 2018 අය වැයෙන් 207 – 1 ශීර්ෂයෙන් රු 100000.00 මුදලක් වෙන් කර තිබෙනවා. එක් අයෙකුට රු. 5000.00 ක ආධාර මුදලක් ලබා දෙන්න පුළුවන්. මෙම ආධාර මුදල අපි අදියර වශයෙන් ලබා දෙමු. මෙහිදී අපේ අනෙක් මන්ත්‍රීවරුන් එවැනි වැසිකිළි නැති අය සිටිනවා නම් ඉල්ලීමක් සිදු කරන්න. එහිදී අපිට පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කළ යුතු වෙනවා. එම පහත සඳහන් ලිපි ලේඛන අප වෙත ඉදිරිපත් කළ පසු ප්‍රධාන අමාත්‍යතුමාගේ අනුමැතිය ඇතිව අදාළ ආධාර මුදල කේ. එම්. අරුණ ප්‍රදීප් කුමාර මහතාට ලබා දෙමු.

- සනීපාරක්ෂක වැසිකිළියක් ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම් ලිපිය.
- තම නිවසෙහි සනීපාරක්ෂක වැසිකිළියක් නොමැති බවට ග්‍රාම නිලධාරී සහතිකයක්
- ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්

කේ. එම්. අරුණ ප්‍රදීප් කුමාර මහතාට ප්‍රධාන අමාත්‍ය අනුමැතිය ඇතිව සනීපාරක්ෂක වැසිකිළියක් සඳහා ලබා දෙන රු. 5000.00 ක ආධාර මුදල ලබා දීම සම්බන්ධව විවාදිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතික සභා සම්මත විය.

## 08 – 20. සිසු නිපුණතා ඇගැයීම් සඳහා ත්‍යාග ලබා ගැනීම.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.**

කටුවන ප්‍රාදේශීය ශාසනාරක්ෂක බල මණ්ඩලයේ ප්‍රාදේශීය සිසු නිපුණතා ඇගැයීම් 2018 සැප්තැම්බර් මස 23 වැනි ඉරු දින මිද්දෙනිය මහා විද්‍යාලයේදී පැවැත්වේ. ඒ සඳහා දහම් පාසල් 31 ක සිසු සිසුවියන් සහභාගී වේ. තරඟ විනිශ්චය කටයුතු සඳහා විනිශ්චය මණ්ඩලය 150 ක් පමණ පැමිණීමට නියමිතය. මේ සඳහා ලක්ෂ හතර හමාරක් පමණ වැය වෙනවා. සිසු නිපුණතා ඇගැයීම්වලට ඉදිරිපත් වන සිසුන්ට ලබා දීම සඳහා පහත සඳහන් ආකාරයට ත්‍යාග ලබා දීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙස යෝජනා කරමි.

සිසුන් සඳහා අවශ්‍ය ත්‍යාග :-

- ප්‍රථම ස්ථානය සඳහා පොත් පාර්සල් 41 ක් - පිටු 160 පොත් 410 ක්
- දෙවන ස්ථානය සඳහා පොත් පාර්සල් 41 ක් - පිටු 160 පොත් 369 ක්
- තුන්වන ස්ථානය සඳහා පොත් පාර්සල් 41 ක් - පිටු 160 පොත් 328 ක්

- හතරවන ස්ථානය සඳහා පොත් පාර්සල් 41 ක්   - පිටු 160 පොත් 287 ක්
- පස්වන ස්ථානය සඳහා පොත් පාර්සල් 41 ක්   - පිටු 160 පොත් 246 ක්

අවශ්‍ය මුළු පොත් ප්‍රමාණය - 1640

ගරු ප්‍රා.ස.ම. ඊ. බී. ඉන්දික මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අපිට මෙපමණ පොත් සංඛ්‍යාවක් ලබා දෙන්න ක්‍රමයක් නැහැ. අපි අපේ මන්ත්‍රීවරු එකතුවෙලා ඒ වෙනුවෙන් ආධාරයක් සිදු කරමු.

සිසු නිපුණතා ඇගැයීම සඳහා ගරු මන්ත්‍රීවරු සියළු දෙනා එක්ව සහයෝගයක් ලබා දීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## <u>08 – 21. මාර්ගය පිළිසකර කර ගැනීම සම්බන්ධව.</u>

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

මීද්දෙනිය නගරයට ගමන් කිරීම සඳහා ඇති කෙටිම මාර්ගය වන මුලන්යාය සිට චන්ද්‍රසිරි බේකරිය දක්වා මාර්ගය මේ වන විට පවුල් 200 ක් පමණ එදිනෙදා පරිහරණය කරයි. එමෙන්ම පාසල් ළමුන් බොහෝ ප්‍රමාණයක් මෙම මාර්ගය භාවිත කරයි. මේ වන විට මෙම මාර්ගය දැඩි අබලන් තත්ත්වයට පත්ව ඇති බැවින් ජනතාව බොහෝ අපහසුතාවයට පත්ව ඇත. එම නිසා මෙම මාර්ගය පිළිබඳ තාක්ෂණික නිලධාරී හරහා ඇස්තමේන්තුවක් සකස් කර සහා අරමුදල් යොදවා මෝටර් ග්‍රේඩර් කර පිළිසකර කර දීම සුදුසු යැයි යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. ජේ. ඒ. ගාමිණී මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

මුලන්යාය සිට චන්ද්‍රසිරි බේකරිය දක්වා මාර්ගය ඇස්තමේන්තු සකස් කර සහා අරමුදල් යොදවා ප්‍රතිසංස්කරණය කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සහා සම්මත විය.

## <u>08 – 22. වරාපිටිය පොදු වෙළඳ පොළ සම්බන්ධව.</u>

**<u>ගරු ප්‍රා.ස.ම. ජේ. ටී. ශාන්ත මැතිතුමා.</u>**

වරාපිටිය පොදු වෙළඳ පොළ ආරම්භ කර දැනට වසර 42 ක් පමණ වෙනවා. නමුත් මේ වන විට බීමට වතුර, වැසිකිළි පහසුකම් නැහැ. එමෙන්ම මාර්ග පහසුකම්ද ප්‍රමාණවත් නැත. මෙම අඩුපාඩු සකස් කර දෙන ලෙස යෝජනා කරමි. එමෙන්ම තේ කඩ බදු දීමේදී ද ප්‍රමාණවත් පහසුකම් නොමැත. ඇතැම් කඩ කාමර වසා දමා ඇත. එම කඩ කාමර බදු මුදල් ගෙවන්නේද නැත. එමඟින් පාඩුව සිදු වන්නේ සභාවටය. මෙම කඩ කාමර විකිණීම නීති විරෝධී ක්‍රියාවක් වන අතර, ඇතැම් කඩ කාමර විකුණා ඇත. ඒ පිළිබඳ නිලධාරීන් සොයා බලා නොමැත. ඒ නිසා මේ පිළිබඳ සොයා බලා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස යෝජනා කරමි.

දැනට වරාපිටිය පොදු වෙළඳ පොළ බදාදා දින උදය වරුවේ පවත්වනු ලැබේ. කැකිරිඔබඩ, කරමැටිය, ඌරුබොක්ක යන වෙළඳ පොළ ඉරිදා උදය වරුවේ පවත්වනු ලැබේ. මෙම වෙළඳුන්ට වරාපිටිය පොළට සහභාගි වීමට හා පහලවත්ත, එගොඩබැද්ද, වරාපිටිය, හඳුගල, පාතේගම, වීදපොල, දෙහිගහහේන, තලපත්කන්ද හා රම්මල යන ගම්මානවල පාරිභෝගිකයින්ගේ යහපත උදෙසා බදාදා දිනට අමතරව වරාපිටිය සති පොළ ඉරිදා දින සවස පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. සිරිසේන හෙට්ටිගේ මැතිතුමා එම යෝජානව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රා.ස.ම. ඊ. බී. ඉන්දික මැතිතුමා.**

ඒක ගොඩක් හොඳයි. රාජ්‍ය සේවකයින්ටත් ඉරිදා පොළ පවත්වන විට සහභාගි වෙන්න පුළුවන්.

**ගරු ප්‍රා.ස.ම. එම්. සී. පී. කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා.**

ඉරිදා කරමැටිය පොළ පවත්වන දවස. කරමැටිය පොළට ගැටළුවක් වෙන්නෙ නැතිව පවත්වමු.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපි වරාපිටිය පොළ පැවැත්වීම හා පොළ තුළ තිබෙන ගැටළු පිළිබඳ පොළ භාරකරු හා කිරම කලාපය භාර ආදායම් පරීක්ෂක යන දෙදෙනාගෙන් යුත් කමිටුවක් පත් කර වර්තාවක් ලබා ගෙන ඒ අනුව කටයුතු සිදු කරමු. කරමැටිය පොළ පවත්වන ඉඩම අයිති අය අපෙන් ගේ හදාගන්න ඉඩම ඉල්ලනවා. එහෙම වුණොත් පොළ පවත්වන්න අපිට තැනක් නැහැ. ඒ නිසා මේ හදලා තියෙන තත්ත්වයෙන් හෝ පොළ එම ස්ථානයට ගන්න වෙනවා. රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව පොල හදන්න ප්‍රතිපාදන නැහැ කියනවා.

**ගරු ප්‍රා.ස.ම. යූ. ජී. ධර්මසිරි මැතිතුමා.**

වෙන ඉඩමක් ගන්න තැනක් නැද්ද? ඉඩමේ අයිතිය අපි අයිතිකරුට පවරා දෙන්න වෙනවා.

**ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.**

අපි මේ පිළිබඳ මාධ්‍යයට දාමු. එවිට ගැටළුව විසඳගන්න පුළුවන් වෙයි.

**ගරු ප්‍රා.ස.ම එම්. සී. පී. කැලුම් තුෂාර ගරුසිංහ මැතිතුමා.**

කරමැටිය පොලේ ගැටළුව තවම විසඳා දුන්නෙ නැහැ. ලැබුණු මුදලින් පොළ නිසි පරිදි සකස් කලේ නැහැ. මාධ්‍ය ගෙනත් සාකච්ඡා කළත් ඒවා මාධ්‍යවල පළවෙන්නෙ නැහැ. පොළ සකස් කරන්න ගෙනත් තිබූ අමු ද්‍රව්‍ය ටිකත් පටවා ගෙන ගියා. සභාපතිතුමා පොලිසියෙ පැමිණිල්ලක් දැම්මා. ඔවුන් ලිඛිතව පොළ හදන්න පොරොන්දු වුණා කිව්වා. නමුත් දැන් මාස කිහිපයක් ගත වී ඇතත් පොළ හැදුවෙ නැහැ. දැන් පොළ පවත්වන ඉඩම අයිතිකරුට ලබා දෙනවනම් අපි මහා මාර්ගය භාවිතා කර පොළ පවත්වන්න කටයුතු කරනවා.

**ගරු ප්‍රා.ස.ම. ඒ.පී. නිශාන්ත මැතිතුමා.**

අපි මේ සඳහා උද්ඝෝෂණයක් සිදු කරමු.

**ගරු ප්‍රා.ස.ම. ඊ. බී. ඉන්දික මැතිතුමා.**

මේ සඳහා උද්ඝෝෂණ කළා. නමුත් වැඩක් වුනේ නැහැ නේද?

**ගරු ප්‍රා.ස.ම. එම්. ඩී. සුගතදාස මැතිතුමා.**

එම පොළ සකස් කිරීම හා සම්බන්ධ ආයතනවලට මේ පිළිබඳ දැනුම් දෙන්න.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

දැයට කිරුළ සමඟ මෙම පොළ සකස් කරන්න ප්‍රතිපාදන ලැබුණා. නමුත් ව්‍යාපෘතිය අවසන් කර නැහැ. එම මුදලින් ඉංජිනේරු සංස්ථාවේ නිලධාරීන්ගේ පඩි ගෙවා තියනවා. මාධ්‍ය ගෙන්වා කරුණු පෙන්වා දුන්නද ඒවා මාධ්‍යවල පළ කරන්න දෙන්නෙ නැහැ. දැන් පොළ පවත්වන ඉඩම අයිතිකරුට ලබා දිය යුතු නිසා කරමැටිය පොළ සකස් කරන තෙක් දැනට තිබෙන තත්ත්වයෙන් අපි එම ස්ථානයේ පොළ ආරම්භ කරමු.

වරාපිටිය පොදු වෙළඳ පොළ ඉරිදා දින සවසට පැවැත්වීමට හා එහි තිබෙන ගැටළු පිළිබඳ පිළිබඳ පොළ භාරකරු හා ආදායම් පරීක්ෂක යන දෙදෙනාගෙන් වර්තාවක් ලබා ගෙන ඒ අනුව කටයුතු කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08 – 23. නොපැමිණි මන්ත්‍රීවරුන්ට නිවාඩු අනුමත කිරීම.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අද දින අසනීප නිසා සභාවට සහභාගි වීමට නොහැකි බව දන්වා ඇති පහත නම් සඳහන් මන්ත්‍රීවරුන්ට නිවාඩු අනුමත කිරීම සුදුසු යැයි යෝජනා කරමි.

- ගරු ප්‍රා.ස.ම. කේ. එච් චන්ද්‍රසේන මැතිතුමා
- ගරු ප්‍රා.ස.ම. ඩබ්. සී. එම්. චමිල් උදාර මැතිතුමා
- ගරු ප්‍රා.ස.ම. රන්ජන් වීරසේකර මැතිතුමා
- ගරු ප්‍රා.ස.ම. ඩී. රාජසිංහ මැතිතුමිය
- ගරු ප්‍රා.ස.ම. එන්. ඒ. එස්. වීරසිරි මැතිතුමිය
- ගරු ප්‍රා.ස.ම. ජේ. චන්ද්‍රලතා මැතිතුමිය

ගරු ප්‍රා.ස.ම. සුගත් සරඹගේ මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

ඉහත නම් සඳහන් නොපැමිණි මන්ත්‍රීවරුන්ට නිවාඩු අනුමත කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## 08 – 24. මිද්දෙනිය ජල පොම්පාගාරය අසල සිටින වවුලන් පලවා හැරීම.

**ගරු ප්‍රා.ස.ම. ජේ. ඒ. ගාමිණී මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මිද්දෙනිය ජල පොම්පාගාරය අසල ගස්වල සිටින වවුලන් නිසා එම ප්‍රදේශයේ දැඩි දුර්ගන්ධයක් පවතිනවා. අපගේ ජල පොම්පාගරයත් මේ අසල තිබෙන නිසා වවුලන්ගේ අපද්‍රව්‍ය එයට මිශ්‍රවිය හැකියි. එම නිසා මෙම සතුන් පලවා හැරීම සඳහා ක්‍රමවේදයක් සකස් කර දෙන්න.

මල්වානේ රඹුටන් කෑම සඳහා එන සතුන් පළවා හැරීමට එම ගස්වල එලාම් එකක් සවි කර තිබෙනවා. එවැනි වැඩපිළිවෙළක් සකස් කරන ලෙස යෝජනා කරමි.

ගරු ප්‍රා.ස.ම. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදි.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අපි මෙම වවුලන් පළවාහරින්න එක් වතාවක් රතිඤ්ඤා පත්තු කළා. ඒ අවස්ථාවේ යනවා. නමුත් ටික වෙලාවකින් නැවත පැමිණෙනවා. ඒ නිසා වෙන වැඩ පිළිවෙළක් සකස් කරන්න වෙනවා. එම ස්ථානයේ තිබෙන අපගේ ජල පොම්පාගාරය සඳහා වවුලන්ගේ අපද්‍රව්‍ය මිශ්‍ර වෙන්නෙ දෙන්න බැහැ. ඒ නිසා අපි වවුලන් පළවා හරින්න අවශ්‍ය කටයුතු සිදු කරමු.

මිද්දෙනිය ජල පොම්පාගාරය අසල සිටින වවුලන් පළවා හැරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධව විවාධිත අදහස් නොවූ බැවින් සියළු මන්ත්‍රීවරුන්ගේ එකඟතාවය මත ඒකමතිකව සභා සම්මත විය.

## <u>09 - ප්‍රගතිය සාකච්ඡා කිරීම.</u>

**<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්.ඩී.එම්.ඩී. හරිස්චන්ද්‍ර මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, අප සභාව මඟින් පවත්වා ගෙන යන ජල යෝජනා ක්‍රමය මඟින් ප්‍රමාණයට වඩා ජල සැපයුම් ලබා දීම සිදු කරනවා. නමුත් ප්‍රමාණවත් පරිදි ජලය ජල මූලාශ්‍රවල නොමැති වීම නිසාත් කාලයක සිට මුර ක්‍රමය යටතේ අදාළ ප්‍රදේශවලට වතුර ලබා දෙනු ලැබේ. එහෙත් වර්තමානයේ ඇතැම් අවස්ථාවල මෙම මුර ජල ක්‍රමය වෙනස් කර ජලය බෙදා හැර ඇති බව දැනගන්නට ලැබී තිබෙනවා. එසේ වීමට හේතුව කුමක්ද? එසේ වෙනස් වුණොත් අවසන් දින ජලය වදින නිවෙස් සඳහා වතුර වදින්නෙ නැහැ. මෙවැනි ක්‍රමයකදී වතුර නොවදින දිනවලදී දානයක්, මළගෙදරක් වෙලාවට බවුසර්වලින් වතුර ලබා දෙන්න වෙනවා.

**<u>ගරු ප්‍රා.ස.ම. ජේ. ඒ. ගාමිණී මැතිතුමා.</u>**

අපේ ගෙදරට වතුර වදින්නේ එක දිගට දවස් තුනක් වතුර දුන්නොත් පමණයි. එදිනට වතුර වදින්නත් පුළුවන් නොවදින්නත් පුළුවන්.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

අපි මුර ක්‍රමයට වතුර ලබා දෙනවා. නමුත් එම ක්‍රමය නොදන්වා වෙනස් කරන්නෙ නැහැ. තවම වෙනස් කරලා නැහැ. මේ කාලයේ වතුර අඩු නිසා ගැටළු තියනවා.

**<u>ගරු ප්‍රා.ස.ම. ආරියරත්න ඒකනායක මැතිතුමා.</u>**

ගරු සභාපතිතුමනි, පරිසර හා පහසුකම් කමිටුව පසුගිය දිනක එකතු වුණා. එය අවිධිමත් එකතුවීමක්. එවැනි කමිටු රැස්වීම් පිළිබඳ ලිඛිතව දැනුම් දෙනවනම් හොඳයි. සභා රැස්වීමක් පැවැත්වීමට නම් වැඩ කරන දින හතරකට පෙර අදාළ සභා වාර්තා මන්ත්‍රීවරුන්ට ලැබෙන්න ඕන. නමුත් මට ලැබුණේ සඳුදා. සමහර අයට සිකුරාදා ලැබී තියනවා.

ගිය සභා වාරයේදී මිද්දෙනිය පනාමුර පාර සුසානභූමි ඉඩමේ දිරා ගිය ලුණුමිදෙල්ල ගසක් කපි ඉවත් කිරීම පිළිබඳ කතා කළා. ඒ පිළිබඳ පත්තරෙත් පළ කර තිබුණා. එය තවම ඉවත් කර නැහැ. එයට හේතුව කුමක්ද?

**ගරු ප්‍රා.ස.ම. එම්. ඩී. සුගතදාස මැතිතුමා.**

කටුවන දැව කැපුම්හල සම්බන්ධව තීරණයක් ගත්තා. නමුත් විධිමත්ව කමිටුව රැස් වුණේ නැහැ. විධිමත් දැනුම් දීමක් නැහැ. දුරකතනය මඟින් දැනුම් දී කමිටුව රැස්වුණා.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

මෙම කමිටුව අපි ගිය සභාවේ ගත් තීරණයක් අනුව රැස්වුණා. නමුත් කමිටු වාර්තාව අපිට තවම ලැබී නැහැ. එම කමිටු වාර්තාව අනුව ඉදිරියට කටයුතු කරමු. සභා වාර්තා අපි සිකුරාදා දින බෙදුවා. මිද්දෙනිය පනාමුර පාර පිහිටි සුසානභූමි ඉඩමේ ඇති ලුණු මිදෙල්ල ගස ඉවත් කිරීම සඳහා ඇස්තමේන්තුවක් සකස් කරන්න කටයුතු සිදු කර තිබෙනවා. කුලී පදනම මත කෙනෙක් අරගෙන එම ගස කපන්න අවශ්‍ය කටයුතු සිදු කරනවා.

**ගරු ප්‍රා.ස.ම. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා.**

ගරු සභාපතිතුමනි, මෙවර ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් විශාල පිරිවැයක් දරා සභාව විසින් කිරම, කටුවන, මිද්දෙනිය යන නගර කේන්ද්‍ර කර ගනිමින් ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණයක් පැවැත්වුවා. නමුත් මිද්දෙනිය සම්මන්ත්‍රණයට මිද්දෙනිය ප්‍රාථමික විද්‍යාලයේ එක් පංතියක දරුවන් පමණයි සහභාගි කර තිබුණේ. අනෙක් පංති 04 හි දරුවන් ඒ සඳහා සහභාගි කර තිබුණේ නැහැ. ගුරුවරුන්ගේ පවතින මතභේද නිසා දරුවන් වැඩසටහන සඳහා සහභාගි කලේ නැහැ. නමුත් ඔවුන්ගේ පෞද්ගලික පංති සඳහා පමණයි දරුවන් සහභාගි කරවන්න දෙන්නේ. එක් ගුරුවරයෙක් අනෙක් ගුරුවරයාගේ පංතියටවත් දරුවන් යවන්න දෙන්නෙ නැහැ. අපි මේ දරුවන් ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණයට සහභාගි නොකිරීම සම්බන්ධව විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

අප සභාවේ සේවය කරන නිලධාරීන්ගේ හා සේවකයින්ගේ යතුරුපැදි නැවත්වීම සඳහා මඩුවක් සකස් කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

එමෙන්ම මිද්දෙනිය රෝහලේ කාන්තා වෛද්‍යවරියන් දෙදෙනෙක් සේවය කරනවා. යම් අවස්ථාවක රාත්‍රී රෝගියකු නැවැත්වීම සඳහා රැගෙන ගිය පසු වෛද්‍යවරිය පැමිණෙන තෙක් බොහෝ වෙලාවක් රැඳී සිටිය යුතු වෙනවා. එම නිසා අපි දැඩි අපහසුතාවයට පත් වෙනවා. මේ පිළිබඳ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදිත් කතා කළා. අපිට පිරිමි වෛද්‍යවරයෙක් ලබා ගන්න පුළුවන්නම් හොඳයි.

පාර්ලිමේන්තුවේ අධීක්ෂණ මන්ත්‍රීවරු 55 දෙනෙකුට ලක්ෂ දෙක බැඟින් ගෙවනවා. අපි ඒ පිළිබඳ දැඩිව හෙළා දකිනවා. දැඩිව විවේචනය කරනවා. මිනිස්සුන්ට දැඩි ආර්ථික අපහසුතාවක් පවතින වෙලාවක මෙවැනි දේ සිදු කිරීමට අපි විරුද්ධත්වය ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රා.ස.ම. ජේ. ඒ. ගාමිණී මැතිතුමා.**

ශිෂ්‍යත්ව වැඩසටහන සඳහා දරුවන් සහභාගි නොකිරීම සම්බන්ධව මම මිද්දෙනිය ප්‍රාථමික විද්‍යාලයේ ගුරුවරු සමඟ සාකච්ඡා කළා. එහිදී ඔවුන් පවසා සිටියේ පාසලේම ගුරුවරයෙක් විසින් එම වැඩසටහන සිදු කළ නිසා දරුවන් සහභාගි නොකළ බවයි. පිට ගුරුවරු විසින් එම වැඩසටහන සිදු කළා නම් දරුවන් සහභාගි කරවන බවයි ඔවුන් පැවසුවේ. මින් ඉදිරියට පිටතින් ගුරුවරු යොදා ගෙන මෙවැනි වැඩසටහන් සිදු කරන ලෙස ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

කිරම හා කටුවන පැවැත්වූ ශිෂ්‍යත්ව සම්මන්ත්‍රණ දෙක අපි සාර්ථකව සිදු කළා. නමුත් මිද්දෙනිය සම්මන්ත්‍රණය සඳහා අඩු පිරිසක් සහභාගි වුණා. අපිට ඒ පිළිබඳ කණගාටුවක් තිබෙනවා. මෙහිදී අපි මිද්දෙනිය ප්‍රාථමික විද්‍යාලයේ ගුරුවරයෙකු හා කිරම ධම්මානන්ද ප්‍රාථමික විද්‍යාලයේ විදුහල්පතිතුමා සම්පත්දායකයින් ලෙස යොදා ගත්තා. මින් ඉදිරියට වෙන සම්පත්දායකයින් යොදා ගන්න උත්සාහ කරමු. සභාවේ සේවකයින්ගේ යතුරුපැදි නැවැත්වීම සඳහා ස්ථානයක් සකස් කරන්න යෝජනා අනුමැතියක් ලබාගෙන තිබෙනවා. අපි සතුව තිබෙන සම්පත්වලින් එය සකස් කර දෙනවා.

**<u>ගරු ප්‍රා.ස.ම. එම්. ඩී. සුගතදාස මැතිතුමා.</u>**

මිද්දෙනිය වටරවුම සකස් කර තිබෙනවා. සභාවේ සැලසුමකට අනුවද සකස් කර තිබෙන්නේ? වියදම් දරන ලද්දේ කවුරුන්ද? එමෙන්ම මටත් සභා වාර්තාව ප්‍රමාද වෙලා ලැබුනේ.

**<u>ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.</u>**

මිද්දෙනිය වටරවුම අපේ සැලැස්මට අනුව සිංහගිරි සමූහ ව්‍යාපාරයේ අධිපතිතුමා වන සනත් මන්ත්‍රීතුමා විසින් තමන්ගේ පෞද්ගලික ධන පරිත්‍යාගයෙන් සකස් කර තිබෙනවා.

**<u>ගරු ප්‍රා.ස.ම. ඩබ්. එච්. ඒ. සනත් චන්ද්‍ර කුමාර් මැතිතුමා.</u>**

මිද්දෙනිය වටරවුම මම විසින් සභා සැලැස්මට අනුව සකස් කළා. තව වැඩ ටිකක් තියනවා සකස් කරන්න. ඒ ටිකත් අවසන් කරන්න ඕන.

**<u>ගරු ප්‍රා.ස.ම. ඊ. බී. ඉන්දික මැතිතමා.</u>**

අපි එතුමාගේ පරිත්‍යාගශීලි ක්‍රියාව අගය කොට සලකනවා.

**<u>ගරු ප්‍රා.ස.ම. එම්. සිරිසේන මැතිතමා.</u>**

අපේ ස්තුතිය මන්ත්‍රීතුමාට ප්‍රකාශ කරනවා.

**<u>ගරු ප්‍රා.ස.ම. මානෙල් දිසානායක මැතිතුමිය.</u>**

ගරු සභාපතිතුමනි, සභාවේ සේවය කළ තුෂාර සංජීව මහතා අනතුරක් වෙලා එක්තැන් වී සිටිනවා. මේ වන විට කිරම රෝහලේ මාස තුනක පමණ සිට ප්‍රතිකාර ලබනවා. ඉතා දුෂ්කර පවුල් පරිසරයක ජීවත් වන මොවුන් හට මේ වන විට වැටුප ලැබෙන්නේ නැති බව පවසා සිටියා. වැටුපෙන් භාගයක් හෝ ලබා දෙන ක්‍රමවේදයක් හදන්න පුළුවන් නම් සකස් කර දෙන්න.

කටුවන ශාසනාරක්ෂක බලමණ්ඩලයට අයත් දහම් පාසල් සඳහා ඉරිදා දින දරුවන්ට දහම් පාසල් යැමට නොහැකි වී තිබෙනවා. එයට හේතු වී ඇත්තේ එදින ටියුෂන් පංති පැවැත්වීමයි. එම නිසා කටුවන ඉරිදා දින ටියුෂන් පංති පැවැත්වීම නතර කරන ලෙස ඉල්ලා සිටිමි.

**<u>ගරු ප්‍රා.ස.ම. කේ. සුනිල් ශාන්ත කුමාර මැතිතුමා.</u>**

අපිවත් මෙම ඉරිදා දින උදැසන පංති පැවැත්වීම තහනම් කරමු. එය අනිවාර්යෙන්ම සිදු කළ යුතුයි.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

අපිට තුෂාර මහතාට වැටුපෙන් භාගයක්වත් දෙන්න බැහැ. අපේ නිලධාරීන් ඔවුන්ගේ පෞද්ගලික ධන පරිත්‍යාග සිදු කර තිබෙනවා. අපි සභා බලප්‍රදේශයේම ඉරිදා දින උදෑසන ටියුෂන් පංති පැවැත්වීම නතර කරමු.

**ගරු ප්‍රා.ස.ම. ජේ. ඒ. ගාමිණී මැතිතුමා.**

එමෙන්ම මිද්දෙනිය ජල බලාගාරය අසල වැව හිස්මත්තේ ත්‍රීරෝද රථ නවතා ගෙන මත්ද්‍රව්‍ය පානය කරනවා. එහිදී හිස් බෝතල් , පොලිතීන් පරිසරයට මුදා හරිනවා. එම නිසා මෙය නතර කර ගැනීම සඳහා දැන්වීමක් සකස් කර එම ස්ථානයේ සවි කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

මිද්දෙනිය ශ්‍රී මහින්ද නාහිමි මාවතේ පදිංචි ජේ. ඒ. සෝමදාස මහතාගේ නිවස කඳුකර ප්‍රදේශයක පිහිටා තිබෙනවා. එහි පහත් බිම ආසන්නයේ ජල නල එලා අන් සතු ඉඩමකින් අවසරය ඇතිව නිවසට ජලය ලබා ගෙන තිබෙනවා. එහිදී ජල මීටරය පාර අයිනේ සවි කර ඇති අතර, එම නිසා ජල මීටරය අනාරක්ෂිත තත්ත්වයට පත්ව ඇත. එම නිසා ජල මීටරය ඔහුගේ නිවස අසලින් සවි කර දෙන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති අයි. ජී. මහින්ද මැතිතුමා.**

වැව් හිස්මත්තේ ඇති බෝතල් , පොලිතීන් අපි ඉවත් කරමු. එහිදි එම ස්ථානයේ කසල බැහැර නොකරන ලෙස දැන්වීමක් සකස් කරමු. ජේ. ඒ. සෝමදාස මහතාගේ ඉල්ලීම පිළිබඳ සොයා බලා අපි අවශ්‍ය කටයුතු සිදු කර දෙන්නම්.

## 10 - ස්තුතිය හා නිමාව

අද දින පැවැත්වූ මහ සභා රැස්වීම සඳහා පැමිණ එය සාර්ථක කර ගැනීම සඳහා අපේ මන්ත්‍රීවරු සියළු දෙනා සහයෝගය දැක්වූවා. ඒ සඳහා පැමිණි ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රීවරු සියලු දෙනාටම මාගේ ආදරණීය ස්තුතිය පුද කරනවා. එමෙන්ම ලේකම් මහතා ඇතුළු නිලධාරී දෙපළටත්, මාගේ ආදරණීය ස්තුතිය පුද කරනවා යැයි ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදී.

ප.ව. 2.00 ට පමණ සභා තොමෝ සතුටින් විසිර ගියහ.

......................

අයි. ජී. මහින්ද මැතිතුමා.

සභාපති,

කටුවන ප්‍රාදේශීය සභාව,

මිද්දෙනිය.